DOI: https://doi.org/10.4038/jdrra.v2i1.35

*The Journal of Desk Research Review and Analysis, Vol. 2, Issue 1, 2024, 28 - 43*

# LOCATION OF THE SINHALA IN REGIONAL LINGUISTIC HISTORICITY AND THE IDENTITY OF SINHALA LANGUAGE

R Arangala[1]

**Abstract**

The purpose of this study is to locate the Sinhala language in the South Asian linguistic area and the Indo-Aryan subgroup and to examine the concepts and ideas related to the origin and evolution of the Sinhala language. The data were collected using document analysis and analysed using content analysis. Building the relevant rationale by analysing and synthesising the results of previous studies is the study path followed here. According to the findings, it is evident that the identity of the Sinhala language is the result of a different evolutionary path than other languages belonging to the Indo-Aryan sub-group of the Indo-European language family. Since Sinhala began to exhibit its independent aspect before the beginning of the 'Modern Indo-Aryan languages', it is justified to consider the Sinhala language as a modern language that emerged from the contact of a Middle Indo-Aryan dialect with the Old Indo-Aryan languages and the languages belong to other language families such as Dravidian and Sino-Tibetan. Although Sanskrit and the language known as 'Pali' are recognised as the 'mother languages' of Sinhala, there is no evidence that Sinhala was initiated as a dialect of either Sanskrit or 'Pali'. According to the historical analysis, several Prakrit vernaculars led to the source of the Vedic language, which was developed and modified as Sanskrit during 5c. B.C. was isolated from the original mainland and developed independently on this island. The mixing of Prakrit dialects on this island and the contact with the languages of the early inhabitants of the island was the first step in the independent aspect of the Sinhala and the contact with the colloquial languages of other nations arrived here due to various socio-economic, political, and cultural relationships led to the preparation of the new face of Sinhala. The origin and evolution of the Sinhala language took place through admixture with other non-Dravidian languages - mainly Tamil, the primary language of the Dravidian language family. The reasons for finding a vocabulary similar to Sanskrit and Pali languages - which are considered to have evolved from them - are that the Prakrit veŕiculars based on those languages are rooted in the source of Sinhala and the development of Sinhala language due to socio-cultural (educational and religious etc.) reasons similar to Sanskrit and Pali languages. It is clear that the use of loan words and a derived vocabulary and the influence of the grammatical features of those languages.

***Keywords:*** linguistic identity, Indo-Aryan subgroup, linguistic area, linguistic divergence, cultural contact

[1]Senior Professor, Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura, Sri Lanka.

Email: arangala@sjp.ac.lk https://orcid.org/0009-0000-0054-935X

The Journal of Desk Research Review and Analysis © 2024 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 14.08.2024
Accepted date: 22.10.2024

# කලාපීය භාෂා ඓතිහාසිකත්වයෙහි සිංහලය ස්ථානගත කිරීම හා සිංහල භාෂාවේ අනන්‍යතාව

ආර්. අරංගල

**සාරසංක්ෂේපය**

මේ අධ්‍යයනයේ අරමුණ සිංහල භාෂාව දකුණු ඉන්දියානු භාෂා කලාපයෙහි හා ඉන්දු-ආර්ය උපගණයෙහි ස්ථානගත කිරීම හා සිංහල භාෂාවේ සම්භවය හා විකාසනය සම්බන්ධ මතවාද ප්‍රතිවිමර්ශනය යි. මෙහි දත්ත සමූහනය සඳහා ලේඛන විශ්ලේෂණ ක්‍රමය භාවිත කළ අතර දත්ත විග්‍රහය සඳහා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය උපයුක්ත යිග පූර්ව අධ්‍යයනයන්හි ප්‍රතිඵල විශ්ලේෂණයෙන් හා සංස්ලේෂණයෙන් අදාළ තාර්කික පදනම ගොඩ නගා ගැනීම මෙහි ලා අනුගමනය කෙරෙන අධ්‍යයන මාර්ගය වෙයි. මේ අධ්‍යයනයෙන් අනාවරණය වූ කරුණු අනුව පැහැදිලි වන්නේ සිංහල භාෂාවේ අනන්‍යතාව සෙසු 'භ්‍රාතෘ' භාෂාවන්ට වෙනස් පරිණාමීය මාර්ගයක විකාසනයෙහි ප්‍රතිඵලයක් බව යි. එසේ ම 'නූතන ඉන්දු-ආර්ය භාෂා' ආරම්භ වීමට පෙර සිංහලය එහි ස්වාධීන මුහුණුවර ප්‍රකට කරමින් වර්ධනය වීම අරඹා සිටි බැවින් එය 'මධ්‍ය ඉන්දු-ආර්ය' භාෂාවක් අන්‍ය භාෂා හා සම්පර්කයට පත් වීමෙන් බිහි වූ නූතන භාෂාවක් සේ සැලකීම යුක්ති යුක්ත ය. සංස්කෘතය හා 'පාලි' නමින් හැඳින්වෙන භාෂාව සිංහලයේ 'මාතෘ භාෂා' ලෙස පිළිගැනීමක් පැවතුණ ද සිංහලය සංස්කෘත හා 'පාලි' භාෂාවල උපභාෂාවක් ලෙස ආරම්භ වුණු බවට සාධක හමු නො වේ. ඓතිහාසික විකාසනය අනුව, සංස්කෘතයට මුල් වූ වෛදික භාෂාවේ ප්‍රභවයට තුඩු දුන් ප්‍රාකෘත ව්‍යවහාර ප්‍රභේද මුල් භූමියෙන් හුදෙකලා වී හා එකිනෙක ව්‍යවහාර ප්‍රභේද සම්මිශ්‍රණය වී මේ දිවයිනෙහි ස්වාධීන ව වර්ධනය වීමෙන් සිංහල නමින් හඳුන්වනු ලබන භාෂාවට පදනම වැටුණු බව පිළිගත හැකි ය. තද් භාෂක සමූහයන්හි සංක්‍රමණයට පූර්වයෙහි දිවයිනේ ව්‍යාප්ත ව පැවති ආදිවාසී භාෂා සමඟත් පසු කාලයෙහි දී මුල් භූමියෙහි භාෂා ව්‍යවහාර හා සංස්පර්ශ නො වූ වෙනත් භාෂා සමඟත් -විශේෂයෙන් ම ද්‍රාවිඪ භාෂා පවුලේ ප්‍රධාන භාෂාව වන දෙමළය - සම්මිශ්‍රණයෙන් සිංහල භාෂාවේ ස්ව ලක්ෂණ හා විකාසනය විෂයයෙහි බල පෑ තීරණාත්මක සාධකයකි. සංස්කෘත හා පාලි භාෂාවලට සමාන - ඒවායින් තද්භව වූ සේ සැලකෙන - වාක් කෝෂයක් සිංහල ව්‍යවහාරයෙහි හමු වනුයේ ඒ භාෂාවලට පදනම් වූ ආදි ප්‍රාකෘත ව්‍යවහාර සිංහලයේ ප්‍රභවයට මුල් වීම හා සිංහල භාෂාවේ විකාසනයේ දී සමාජ, සංස්කෘතික (අධ්‍යාපන හා ආගමික ආදි) හේතු මත තත්සම හා තද්භව වාක් කෝෂයක් ව්‍යවහාරයට ගැනීම හා ඒ භාෂාවල ව්‍යාකරණ ලක්ෂණවල බලපෑම ලැබීම බව පැහැදිලි ය.

***ප්‍රමුඛ පද:*** භාෂා අනන්‍යතාව, ඉන්දු-ආර්ය උපගණය, භාෂා කලාපය, භාෂා අපසාරිතාව, සංස්කෘතික සංස්පර්ශය

## හැඳින්වීම

මේ අධ්‍යයනය සිංහල භාෂාවේ ප්‍රභවය හා විකාසනයත් දකුණු ආසියා භාෂා කලාපයෙහි එයට හිමි ස්ථානයත් සම්බන්ධ මතවාද ප්‍රතිවිමර්ශනය කරමින් දිවයිනේ භාෂා විවිධත්වය හේතුවෙන් 'ශ්‍රී ලංකා භාෂා කලාපයක්' හඳුනා ගත හැකි ද යන්නට අදාළ සාධක විමසා බලන්නකි. මෙය නව දත්ත රැස් කිරීමකින් හෝ ක්ෂේත්‍ර අධ්‍යයනයකින් හෝ තොර ව, ප්‍රවර්තිත සාහිත්‍යය මත පමණක් පදනම් වූ සමාලෝචනාත්මක හා සංස්ලේෂණාත්මක අධ්‍යයනයකි. පූර්ව පර්යේෂණ මත පදනම් වෙමින් ද්විතියික දත්ත විශ්ලේෂණයෙන් හා සංස්ලේෂණයෙන් නව නිගමන කරා එළඹීම මෙහි ලා සිදු කෙරේ. මෙහි අධ්‍යයන සීමාව ප්‍රවර්තිත සාහිත්‍යය මත පමණක් රඳා පවතී. එකී සාහිත්‍යය මූලික වසයෙන් ඓතිහාසික හා සමාජ වාග්විද්‍යාත්මක අධ්‍යයන වන අතර භාෂා පරිණාමය, භාෂා සංස්පර්ශය, භාෂා කලාපීය සාධක හා ජනරේඛනවේදී විග්‍රහ සඳහා තත් සාහිත්‍යික සංයුක්ත විග්‍රහයට ලක් කෙරේ. පූර්ව අධ්‍යයනයන්හි අභිමතාර්ථ හා සන්දර්භ අද්‍යතන තත්ත්වයන්ට වඩා සැලකිය යුතු ලෙස වෙනස් විය හැකි අතර මේ අධ්‍යයනය ඒවායේ ප්‍රතිඵල මත පමණක් රඳා පවතින්නකි. පූර්ව අධ්‍යයනයන්හි දත්තවල ගුණාත්මකභාවය හා යථාභූතභාවය කෙරෙහි අවධානය යොමු කරමින් ඒවා ප්‍රස්තුත අධ්‍යයනයට අදාළ කොට ගැනේ.

## අධ්‍යයන අරමුණු

මේ අධ්‍යයනයේ මුඛ්‍යාධාශය මධ්‍ය ඉන්දු-ආර්ය භාෂා හා ඒවාහි මූල භාෂා සිංහල භාෂාවේ සම්භවය, පරිණාමය හා ඓතිහාසික වර්ධනය විෂයයෙහි දක්වා ඇති බලපෑම් විශ්ලේෂණය කිරීම හා සංස්කෘත හා 'පාලි' භාෂාවලින් සිංහලයේ අපසරණය කෙරෙහි අවධානය යොමු කරමින් ඉන්දු-ආර්ය උපගණයෙන් පරිබාහිර ද්‍රාවිඩ හා මෙතෙක් නිශ්චිත ව හඳුනා නො ගත් මූලයන් සහිත ආදිවාසි භාෂා සිංහල වාක් කෝෂය හා ව්‍යාකරණ ව්‍යූහය කෙරෙහි දක්වා ඇති බලපෑම සම්බන්ධ ප්‍රවර්තිත සාහිත්‍යය ප්‍රතිවිමර්ශනය යි. ඓතිහාසික සන්දර්භ විශ්ලේෂණය මාර්ගයෙන් දිවයින ජනාවාසකරණය හා ඓතිහාසික යුගයේ දී සිදු වූ සංක්‍රමණ රටා ද ආදි 'ස්වදේශීය' භාෂා සමඟ සම්පර්කය ද ඇතුළු ව සිංහල භාෂා පරිණාමයට බල පෑ සමාජ-සංස්කෘතික සංස්පර්ශය ගවේෂණයත් ඒ හේතුවෙන් සිංහලයේ

ශබ්දවිචාර, ශබ්දයෝග විචාර, පදකයෝග විචාර හා වාක්‍ය වින්‍යාස ලක්ෂණ හැඩ ගැසෙමින් සිදු වූ භාෂා ප්‍රවර්ධනයත් කෙරෙහි අවධානය යොමු කරමින් සිංහල භාෂා පරිණාමයේ අවධි වර්ගීකරණය සඳහා පුළුල් රාමුවක් සකස් කිරීමට අදාළ සාධක විමර්ශනයෙන් සිංහල භාෂාව දකුණු ඉන්දියානු භාෂා කලාපයෙහි හා ඉන්දු-ආර්ය උපගණයෙහි ස්ථාපනය කරමින් එහි අනන්‍යතාව හඳුනා ගැනීම එමඟින් අපේක්ෂිත ය.

**ක්‍රමවේදය**

1. සාහිත්‍ය සමාලෝචනයඃ මෙහි ලා ඓතිහාසික වාග්විද්‍යාව ප්‍රමුඛ භාෂාධ්‍යයන ග්‍රන්ථ හා ලේඛන ද අභිලේඛන මූලාශ්‍රය ප්‍රමුඛ අන්‍ය භාෂාමය සාධක ද තදීය සමාජ-සංස්කෘතික පදනමෙහි ලා විශ්ලේෂණයෙන් සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය පිළිබඳ විද්‍යමාන සාහිත්‍යය අළලා පෘථුල විග්‍රහයක් සිදු කෙරේ.

2. ඓතිහාසික වාග්විද්‍යා විශ්ලේෂණයඃ මධ්‍ය ඉන්දු-ආර්ය භාෂාවල සිට නූතන සිංහල දක්වා උච්චාරණ සහ ව්‍යාකරණ වෙනස්කම් සොයා ගැනීමට සංසන්දනාත්මක වාග්විද්‍යාත්මක න්‍යාය උපයෝගි කොට ගැනේ. එමඟින් සිංහල ප්‍රාකෘත අවධියේ සිට සිංහල නමින් හැඳින්විය හැකි ස්වාධීන භාෂාවක ආරම්භය තෙක් භාෂා පරිණාම අවධි සඳහා අභිලේඛන හා සාහිත්‍යික සාධක විමර්ශනය කෙරේ.

**සාකච්ඡාව**

**මූලික සංකල්ප**

**සිංහල භාෂාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය නම් සංවිහිත දේශපාලන ඒකකයෙහි ප්‍රධාන ව්‍යවහාර හා සාහිත්‍යික භාෂාව වන සිංහලයට ස්වභාෂක ජනගහනය අනුව ලෝක භාෂා අතර හිමි වන්නේ 67 වන ස්ථානය යි. සිංහලය වංශීය සම්බන්ධතා (genealogical relationship) අනුව ඉන්දු-යුරෝපීය භාෂා පවුලට ද කලාපීය හෙවත් ක්ෂේත්‍රීය සම්බන්ධතා (areal relationship) අනුව දකුණු ආසියා භාෂා කලාපයට ද අයත් වෙයි.

**භාෂක ප්‍රජාව/භාෂක සමාජය (speech community)**

පොදු භාෂාවක් හෝ උපභාෂාවක් හෝ මාර්ගයෙන් සන්නිවේදනයෙහි යෙදෙන ප්‍රජාවක් භාෂක ප්‍රජාවක් හෝ භාෂක සමාජයක් හෝ (speech community) ලෙස හැඳින්වේ (Hockett, 1958:8; Lyons, 1987: 326). භාෂක ප්‍රජාවක ප්‍රවර්තනය සඳහා සාපේක්ෂ වසයෙන් ස්ථාවර 'ප්‍රදේශයක' භාෂක-ශ්‍රාවක උභය පාර්ශ්වීය සම්බන්ධතා පවත්වා ගෙන යා හැකි 'ජනගහනයක්' හා 'භාෂා ව්‍යවහාරයක්' අවශ්‍ය වෙයි. ඒ අනුව කිසි යම් භාෂාවක් මාර්ගයෙන් සන්නිවේදනයෙහි යෙදෙන දෙදෙනකුගේ අවමයකින් යුතු 'සමූහයක්' පවා භාෂා ප්‍රජාවක් සේ සැලකිය හැකි වෙයි. 'සිංහල භාෂක ප්‍රජාව' යනු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය නම් සංවිහිත දේශපාලන ඒකකයෙහි වෙසෙන එක් 'භාෂක ප්‍රජාවකි'. ඇතැම් භාෂක ප්‍රජාවක් භූ-දේශපාලනික සීමා ඉක්මවූ හා සංවිහිත දේශපාලන කලාප කිහිපයකට අයත් ප්‍රදේශ පුරා ව්‍යාප්ත ව පවතින ආකාරය නිරීක්ෂණය කළ හැකි ය; අරාබි, ඉංගිරිසි, දෙමළ, පුර්තුගීසි හා ස්පාඤ්ඤ භාෂක ප්‍රජා මීට නිදසුන් වෙයි.

**භාෂා පවුල් සංකල්පය හා භාෂා සම්බන්ධ වෙනත් වර්ගීකරණඃ**

**භාෂා පවුල (language family)**

'භාෂා පවුල' යන්න ඓතිහාසික වාග්විද්‍යාවේ පාරිභාෂික යෙදුමකි. භාෂා පවුලක් යනු පොදු පූර්වජ භාෂාවකින් (ancestral language) හෝ පොදු ජනක භාෂාවකින් (parental language) පැවත එන භාෂා සමූහයකි. භාෂා පවුලක හමු වන වෙන් වෙන් භාෂාවලට මුල් වූ සේ සැලකෙන භාෂාව පූර්ව/ ප්‍රාතඃ/ මූල භාෂාව (proto language) ලෙස හැඳින්වේ. මේ මූල භාෂාව ව්‍යවහාරයේ පවත්නා හා සාධක අවශේෂ කොට අභාවයට පත් භාෂාවන්හි ලක්ෂණ අනුව පරිකල්පිත ව ප්‍රතිනිර්මාණය කර ගත්තක් විය හැකි ය (Voeglin and Voeglin, 1975: 662 - 663).

සැම ව්‍යවහාර භාෂාවක් ම නිරන්තරයෙන් වෙනස් වන අතර, එක් ස්ථානයක ව්‍යවහාර කෙරෙන භාෂාවකට බල පාන වෙනස්කම් වෙනත් ස්ථානවල ව්‍යවහාර කෙරෙන භාෂාවකට එලෙසින් ම බල නො පායි. එබැවින්, කිසියම් ප්‍රදේශයක ව්‍යවහාර වන භාෂාවක්, කාලයත් සමඟ වෙනස් ප්‍රභේදවලට බිඳී යාම සිදු විය හැකි ය. ආරම්භයේ දී මේවා යම් භාෂාවක ප්‍රදේශීය උපභාෂා (regional dialects) පමණක් වන නමුත්, ප්‍රමාණවත් කාලයක් ගත වීමේ දී මේ උපභාෂා එකිනෙකට වෙනස් විය හැකි ය. එවිට ඒවා ස්වාධීන භාෂා ලෙස සැලකීමට සිදු වෙයි. එසේ ඇති වන භාෂා ඒවාට මුල් වූ පූර්වජ භාෂාවේ හෝ ජනක භාෂාවේ - 'මාතෘ භාෂාවේ' (mother language) - 'දුහිතෘ

භාෂා' (daughter languages) ලෙස සැලකෙයි. ඒ දුහිතෘ භාෂා සියල්ල ආරම්භ වනුයේ තනි පූර්වජ භාෂාවක හෝ ජනක භාෂාවක (මාතෘ භාෂාවක) ප්‍රදේශීය ප්‍රභේද හෝ සමාජීය ප්‍රභේද හෝ ලෙසිනි. එකිනෙක හා ඥාතිත්වයක් දක්වන කිසියම් භාෂාවක දුහිතෘ භාෂා 'භ්‍රාතෘ භාෂා' (sister languages) ලෙස පිළිගැනේ. මේ ආකාරයෙන් පොදු මුතුන් පූර්වජ හෝ ජනක හෝ භාෂාවකින් බිඳී ආ සියලු ම භාෂා තනි භාෂා පවුලක් සේ සැලකිය හැකි ය. ඒ සියල්ල ප්‍රවේණික හෙවත් පරම්පරාත්මක වසයෙන් සම්බන්ධ බව පෙනී යයි. එවැනි භාෂා පවුල් 100ක් පමණ (ඇතැම් මූලාශ්‍රයයකට අනුව 135-147 අතර ගණනක් (Pariona, 2018) වාග්විද්‍යාඥයන් විසින් හඳුනාගෙන ඇත; ඒවායින් සමහරක් ඉතා විශාල වන අතර අනෙක් ඒවා තරමක් කුඩා වේ (Gordan, 2005:16-23).

**භාෂා පවුල්වලට අයත් නො වන භාෂා**

සමහර භාෂා මූල භාෂාවකින් පැමිණි බව හඳුනා ගත නො හැකි ය. මේවා 'හුදෙකලා භාෂා' (language isolate) ලෙස හඳුන්වනු ලැබේ. නිරිත දිග යුරෝපයේ ස්පාඤ්ඤය හා ප්‍රංසය අතර කලාපයක ව්‍යවහාර කෙරෙන 'බාස්ක්' බස, උතුරු පාකිස්ථානයේ 'බුරුශස්කි'[1] බස හා බ්‍රසීලියානු ඇමේසන්හි පිරාහා ජනතාව කතා කරන පිරාහා ආදි භාෂා 'හුදෙකලා භාෂා' සේ සැලකේ. ඇතැම් භාෂා සම්බන්ධයෙන් වාග්විද්‍යාඥයන්ට ප්‍රමාණවත් දත්ත සපයා ගැනීම අසීරු වී තිබේ. එවැනි භාෂා 'අවර්ගීකෘත භාෂා' (unclassified languages) ලෙස හැඳින්වේ. කෙසේ වෙතත්, ලොව පුරා කතා කරන බොහෝ භාෂා භාෂා පවුලකට අයත් වේ.

**ශ්‍රී ලංකා භාෂා කලාපය හා සිංහලයේ අනන්‍යතා ලක්ෂණ**

**භාෂා කලාපය/ භාෂා ක්ෂේත්‍රය (linguistic area)**

ලෝකයේ ව්‍යවහෘත භාෂා සංඛ්‍යාව 7000ක් පමණ වෙතැයි සැලකේ. මේ භාෂා විවිධාකාරයෙන් එකිනෙකින් වෙනස් වෙයි. එසේ ද වුව වෙන් වෙන් භාෂා අතර සමානතා ද හැඳින ගත හැකි වෙයි. මේ සමානතාවලට ප්‍රධානතම හේතුව සේ සැලකෙන්නේ අන්තර්භාෂාමය වංශීය සම්බන්ධතාව ය. භාෂාවක ව්‍යාප්ත ප්‍රදේශයක වංශීය සම්බන්ධතා සහිත භාෂා මෙන් ම වංශීය සම්බන්ධතා රහිත භාෂා ද පවතී. එබඳු ප්‍රදේශයක් 'භාෂා කලාපය/ ක්ෂේත්‍රය' (ජර්. sprachbund = linguistic area) යනුවෙන් හැඳින්වෙයි. මේ ජර්මානු යෙදුමෙහි අරුත 'භාෂා සම්බන්ධනයක් සහිත ප්‍රදේශය' යන්න යි. එනම් වංශීය සම්බන්ධතාවලින් තොර වූ හෝ දූරස්ථ වංශීය සම්බන්ධතා සහිත හෝ භාෂා සමූහයක් වංශීය සම්බන්ධතාවලින් බැහැරි පොදු ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රදේශයක් 'භාෂා කලාපයක්' ලෙස හැඳින්විය හැකි ය. භාෂා කලාපයක ව්‍යවහාර කෙරෙන භාෂා අතුරෙහි වංශීය සම්බන්ධතා පදනම් කොට ගැනුණු සමානතා දක්නට නැතත් ශබ්දයෝග (phonological), පදයෝග (morphological), වාක්‍ය වින්‍යාස (syntactic), අර්ථ විචාර (semantic) හා වාක් කෝෂීය (lexical) යන ව්‍යූහාත්මක සාධක පදනම් කොට ගැනුණු පොදු ලක්ෂණ මත ඇති වූ සමානතා පැවතිය හැකි ය (Muysken, 2008:1).

**දකුණු ආසියා භාෂා කලාපය** (Emeneau 1956)**:**

දකුණු ආසියාව ලෙස සැලකෙන භූ දේශපාලන කලාපයෙහි ව්‍යවහාර කෙරෙන භාෂා එකිනෙක හා සම්බන්ධයක් නො පෙන්වන භාෂා පවුල් හයකට අයත් සේ හඳුනා ගැනේ (Bright 1990; Masica 1992).

1) ඉන්දු-යුරෝපීය භාෂා පවුල (ඉන්දු-ඉරාණීය ගණයේ ඉන්දු-ආර්ය, ඉරාණීය (දාර්දික හා නූරිස්ථානී) උපගණවලට අයත් භාෂා) (ඉංගිරිසිය වර්තමානයේ දී මේ කලාපයෙහි භූදේශපාලන ඒකක කිහිපයක ම රාජ්‍ය/ නිල භාෂාවක් ලෙස පිළිගැනේ. ඉංදියාව හා පාකිස්ථානය ලොව ඉංගිරිසි ව්‍යවහාර කරන රටවල් අතුරින් දෙවන හා තෙවන තැන් හිමි කොට ගනී. එබැවින් ඉන්දු-යුරෝපීය පවුලේ ජර්මනික් ශාඛාව ද දකුණු ආසියා භාෂා දෘෂ්ටි මණ්ඩලයෙහි ඇතුළත් වෙයි.)
2) ද්‍රාවිඩ භාෂා පවුල (Krishnamurti, 2003)
3) සිනෝ ටිබෙටියන් භාෂා පවුල (ටිබෙටෝ-බර්මන් ශාඛාව ඔස්සේ) (Thurgood and LaPolla, 2003)
4) ඔස්ට්‍රෝ-ඒශියටික් භාෂා පවුල (මුණ්ඩා හා ඛසික් ශාඛා ඔස්සේ) Anderson, 2008)
5) ක්‍රා-දයි හෙවත් ටායි-කඩායි
6) අන්දමන් දූපත්වල ව්‍යවහාර කෙරෙන භාෂා අයත් වන Great Andamanese හා Ongan යන භාෂා කාණ්ඩ ඇතුළත් අන්දමන් භාෂා පවුල (Abbi, 2003)
7) දේශපාලන, වාණිජ හා ආගමික බලපෑම් හා සංස්පර්ශය හේතුවෙන් හින්දී, උර්දු හා මරාටි ආදි භාෂා කිහිපයක වාක් කෝෂය කෙරෙහි හා උර්දු අක්ෂර මාලාව කෙරෙහි ඇෆ්රෝ-ඒශියාටික් පවුලට අයත්

> අරාබි භාෂාව බල පා තිබේ. ඉන්දියාව නම් සංවිහිත දේශපාලන ඒකකයෙහි අරාබි හා හීබ්රූ භාෂකයන් ස්වල්පයක් පිළිබඳ තොරතුරු වාර්තා වන නමුදු එය ප්‍රතිශතයක් ලෙස සලකත හොත් නො සැලකිය හැකි තරම් වෙයි. ශ්‍රී ලංකාවෙහි අරාබි භාෂක ප්‍රජාව ප්‍රතිශතාත්මක ව ඉහළ අගයක් ගනී.

භාෂා පවුල් කිහිපයකට අයත් භාෂා 1100කට ආසන්න ප්‍රමාණයක් මේ කලාපයෙහි ව්‍යවහාර වෙයි. එය ලෝක ව්‍යවහාර භාෂා අතරින් සියයට 15ක පමණ ප්‍රතිශතයකි. මේ හේතුවෙන් දකුණු ආසියා භාෂා කලාපය ඉහළ භාෂා විවිධත්වයක් (linguistic diversity) සහිත ප්‍රදේශයක් සේ සැලකේ.

**දකුණු ආසියානු භාෂා කලාපයේ ලේඛන පද්ධති**

දකුණු ආසියා භාෂා කලාපය ලේඛන පද්ධතිවල පෘථුල විවිධත්වයකින් සංලක්ෂිත වෙයි. එකිනෙකින් වෙනස් ලේඛන පද්ධති කලාපයේ භාෂා විවිධත්වය මෙන් ම සංස්කෘතික විවිධත්වය ද පිළිබිඹු කරයි. බොහෝ සමකාලීන දකුණු ආසියානු ලේඛන පද්ධති බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් ව්‍යුත්පන්න වූ ඒවා ය. දකුණු ආසියාතික ලේඛන පද්ධති සියල්ලේ ම පාහේ ආදිතමයා ලෙස සැලකෙන බ්‍රාහ්මී අක්ෂර මාලාවේ ප්‍රභවය ක්‍රි.පූ. 8 - 7 සියවස් පමණ කාලයකට දිවෙන බවට මතවාද ඉදිරිපත් වී තිබේ. එහි ආදිතම භාවිතය සේ ස්ථිර ව පිළිගැනෙන්නේ ක්‍රි. පූ. තෙවන සියවසට කාල නිර්ණය කෙරෙන අශෝක ලේඛන යි. ක්‍රි. ව. පළමු සහස්‍රයේ ආරම්භයේ දී බ්‍රාහ්මී අක්ෂර මාලාව විවිධ ප්‍රදේශීය ලේඛන ක්‍රම බවට පරිණාමය වූ අතර, ප්‍රධාන ශාඛා දෙකක් හඳුනා ගත හැකි ය. ඒ වූ කලී වඩාත් කෝණාකාර අක්ෂර රූප සහිත උතුරු කණ්ඩායම හා වෘත්තාකාර අක්ෂර රූප සුලබ දකුණු කණ්ඩායම වසයෙනි. අග්නිදිග ආසියාවේ ලේඛන පද්ධති ද බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් සකස් වූ ඒවා වන අතර එහි ලා බල පා ඇත්තේ කලාපීය සංස්කෘතික සම්බන්ධතා බව පෙනේ. හින්දී, සංස්කෘත හා මරාති ආදි භාෂා සඳහා භාවිත වන දේවනාගරී අක්ෂර මාලාව බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් ව්‍යුත්පන්න වූ ප්‍රධාන අක්ෂර මාලාව වන අතර බෙංගාලි, ඇසෑමීය, සිංහල ආදි ආර්ය භාෂාවන්හි මෙන් ම දෙමළය ප්‍රමුඛ ද්‍රාවිඪ භාෂා ලේඛනගත කිරීමට යොදා ගැනෙන ස්වාධීන අක්ෂර මාලා ද බ්‍රාහ්මී අක්ෂර මාලාවෙන් ව්‍යුත්පන්න වූ ඒවා ය. ඉස්ලාමීය සංස්කෘතික බලපෑමට ලක් වූ බටහිරි හා වයඹ කලාපයේ ව්‍යවහෘත උර්දු ආදි භාෂා සඳහා ව්‍යවහාර කෙරෙනුයේ පර්සියානු-අරාබි අකුරු ඇසුරෙන් සකසා ගැනුණු අක්ෂර මාලාවකි (King 2001). දකුණු ආසියාවේ ව්‍යවහාර භාෂා හා අක්ෂර අතර පවත්නා සංකීර්ණ සම්බන්ධය භාෂාමය සාධක මත නො ව සංස්කෘතික සාධක ඇති වූවකි. එය සන්නිවේදන අවශ්‍යතා හා කලාපීය සංස්කෘතික විචිත්‍රත්වය සම්බන්ධ ලක්ෂණයක් මෙන් ම භාෂාමය අනන්‍යතාව මෙන් ම දේශපාලනය ගැටළු ද සමඟ ආබද්ධ සංසිද්ධියක් සේ සැලකිය හැකි ය (Daniels and Bright 1996).

**භාෂාව, ලේඛනය හා ජනරේඛනවේද සාධක**

වංස කථාව හා ජනප්‍රවාද මඟින් පැවසෙන්නේ දිවයිනේ නව ශිෂ්ටාචරය ක්‍රිස්තු පූර්ව පස් වන සියවසින් පසු ව ආරම්භ වූවක් බව ය. එසේ ද වුව උතුරු ඉන්දියානු සම්බන්ධතා සහිත නව ශිෂ්ටාචාරයක ආරම්භය පිළිබඳ පුරාවිද්‍යා සාධක ක්‍රිස්තු පූර්ව පළමු සහස්‍රකයේ මුල් භාගය තරම් ඈතට දිවෙන බව පෙන්වා දෙනු ලැබේ. දැනට ඒ සම්බන්ධ ප්‍රමුඛතම සාධකය මෙන් දකුණු ආසියා කලාපයේ අක්ෂර භාවිතය සම්බන්ධ පැරණි ම නිදර්ශක ද සේ සැලකෙනුයේ 1984 දී අනුරාධපුර ඇතුළු නුවර ප්‍රදේශයේ සිදු කෙරුණු පුරාවිද්‍යා ගවේෂණවල දී අනාවරණය කර ගන්නා ලද බ්‍රාහ්මී අක්ෂර රූප සහිත වළන් කැබලි කිහිපය යි. අදාළ සන්දර්භය සඳහා Deraniyagala (1992: 739-750) දක්වන විකිරණ කාල ගණනා ක්‍රමය මඟින් ඉදිරිපත් කෙරෙන කාල නිර්ණය ක්‍රිස්තු පූර්ව 600-500 තරම් ඈතට දිවෙන්නක් ය යන අදහස මේ මැටි බඳුන් කැබලි සඳහා ද අදාළ වෙතැයි පිළිගනිතොත් මේවා මෙතෙක් දකුණු ආසියාවෙන් හමු වී ඇති පැරණි ම බ්‍රාහ්මී අක්ෂර සේ සැලකීමට සිදු වෙයි. මීට පෙර පැරණි ම බ්‍රාහ්මී ලේඛනය සේ සැලකුණු පිප්‍රාවා කරඬු ලිපිය අක්ෂර රූපාකාරය අනුව මුල දී අදහස් කළ අන්දමට ප්‍රාග්-මෞර්ය අවධියට නො ව ක්‍රි.පූ. තෙවන සියවසට අයත් සේ සැලකිය හැකි බැවින් උත්තර භාරතීය බ්‍රාහ්මී ලේඛනයන්හි ආදිතම අන්තය අසෝක සමය සේ පිළිගැනීමට සිදු වෙයි (Dani, 1986). පූර්වෝක්ත ගවේෂණයෙහි සන්දර්භයට අදාළ කාල නිර්ණය මේ බ්‍රාහ්මී අක්ෂර රූප වළන් කැබලි හා පන්හිද කොටස් වසයෙන් හඳුනා ගනු ලබන අස්ථිමය ශිල්පකර්ම සාධක සඳහා ද අන්‍ය වෙතැයි සැලකුව හොත් පමණක් දිවයිනේ ලේඛන කටයුතුවල ආරම්භය ක්‍රි.පූ. 600-500 වකවනුවට දිවෙන බව පිළිගත හැකි ය (Deraniyagala, 1992: 740). එහෙත් අදාළ නිදර්ශන අක්ෂරරූපවිද්‍යාත්මක ව මෙන් ම වාග්විද්‍යාත්මක ව ද භාරතීය සම්භවයක් පෙන්නුම් කරන බවට ඇති මතය වේ (Deraniyagala, 1992: 745-746). එයින් බිඳ නො වැටේ. අදාළ කාල නිර්ණය ඉදිරිපත් කොට ඇත්තේ ස්තර සඳහා වන අතර එකී කාල නියමය සම්බන්ධයෙන් සිරාන් දැරණියගල පැහැදිලි ව පවසන පරිදි මේ කාල නිර්ණයනය අදාළ වන්නේ අධ්‍යයනයට ලක් වූ සිවු වන ස්තරයට විනා අකුරු සහිත වළං කැබලිවලට නො වන බව සැලකිය යුතු ය: ''අසම්බන්ධ මූලාශ්‍රයයක්

(එනම් කුරුටු අකුරු සහිත වළං කැබලි ම (පමණක්) තාපසංදීප්තතා කාල නිර්ණයනය කිරීම) මඟින් ස්වාධීන කාල නිර්ණයනය කිරීමකින් ඉහත තර්කය ඛණ්ඩනය නොකරන්නේ නම්, විකිරණශීලී කාබන් සහ තාපසංදීප්තතා කාල නිර්ණයනය මඟින් පමණක් නොව, AMP: 88 (75)හි සංඝටිත සංස්කෘතික රාශිගත වීම පිළිබඳ සියලු පරිවේෂණීය සාධක මඟින් ද සමර්ථනය කෙරෙන මේ උපකල්පනය සාධාරණීකරණය කළ හැකි ය'' (Deraniyagala, 1992: 744). ("It can thus be affirmed that an independent source of absolute dating; e.g. TL on the inscribed shreds themselves & refutes the above argument, which is supported not only by the radiocarbon and TL dating but by all the circumstantial evidence of the associated cultural assemblage in AMP: 88 (75), one is justified in assuming its validity")

මෙතෙක් හමු වී ඇති දක්ෂිණ භාරතීය බ්‍රාහ්මී ලේඛන ද ඒ හා සමකාලීන බව හෝ ඇතැම් විට ක්‍රි.පූ. දෙවන සියවසට වඩා ඈතට ගෙන යා නො හැකි බව කියනු ලැබේ. බ්‍රාහ්මී අක්ෂරයන්හි සම්භවය කිකලක සිදු වුව ද එය උත්තර භාරතයේ සිට පැමිණි මුල් ම ජානපදිකයන් විසින් මෙරටට හඳුන්වා දෙන්නට ඇතැයි ද මෙකියන මැටි බඳුන් කැබලි ලිපි එහි ප්‍රතිඵලයක් විය හැකි යැයි ද නිගමනය කිරීහ ශාස්ත්‍ර යුක්තියට එකඟ වෙයි. බ්‍රාහ්මී අක්ෂර මාලාව බටහිර ආසියානු සෙමිටික් වෙළෙඳුන් මාර්ගයෙන් සම්භවය වූවක් ය යන මතය සැලකීමේ දී විජයාගමනය යනුවෙන් වංස කථාවේ හා ජනප්‍රවාදයන්හි සඳහන් වන උත්තර භාරතීය ජන සංක්‍රමණයට සමකාලීන ව හෝ ඊට පූර්වයෙහි හෝ මෙරටට පැමිණි බටහිර ආසියානු ජනයාගේ දායකත්වය කෙරෙහි ද ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතු වෙයි (Deraniyagala, 1992: 744; 1998 :284). ඉන්දු-නිම්න ශිෂ්ටාචාර වාසීන් වෙළෙඳ ගනුදෙනු සඳහා සුමේරියානු ප්‍රදේශවලට ගොස් ඇති බවට සාධක හමු වන බැවින් වාණිජ අවශ්‍යතා සඳහා මේ දිවයිනට ද ඔවුන්ගේ සම්බන්ධයක් නො පැවතිණි යි සැලකිය යුතු නො වේ. මේ දිවයිනේ නව ශිෂ්ටාචාරයෙහි පදනම වැටෙනුයේ ක්‍රිස්තු පූර්ව පළමු සහස්‍රකය ආරම්භයෙහි පටන් සිදු වූ සංක්‍රමණවල ප්‍රතිඵල වසයෙනැයි ඒ අනුව නිගමනය කළ හැකි ය.

**සිංහලය අයත් වන භාෂා පවුල**

සිංහලය බෙංගාලි, හින්දී, දිවෙහි, උර්දු, ගුජරාටි, මරාටි ආදි භාෂා සමූහයකට සමීප ව සම්බන්ධ වේ (Geiger 1919). මේවා සාමාන්‍ය කථන ව්‍යවහාරයෙහි නොමැති සංස්කෘත හා පාලි යන භාෂාවලට ද සම්බන්ධ වෙයි. මේ භාෂා 'ඉන්දු-ආර්ය' භාෂා යනුවෙන් හඳුන්වනු ලැබේ. ඉන්දු-ආර්ය භාෂා ක්‍රිස්තු පූර්ව දෙවන සහස්‍රකයෙහි පමණ උතුරු ඉන්දියාවට සංක්‍රමණය වූ ප්‍රදේශීය උපභාෂා සන්තතියකින් පැවත එන සේ සැලකිය හැකි ය. මේ ඉන්දු-ආර්ය භාෂා ඇෆ්ඝනිස්ථානය, ඉරාණය යන රටවල ව්‍යවහාර කෙරෙන පර්සියන්, පෂ්ටෝ, කුර්දිෂ්, බලූචි, දාරි ආදි 'ඉරාණීය' භාෂා සමඟ සමීප ප්‍රවේණික සම්බන්ධයක් පෙන්නුම් කරයි. ඇෆ්ඝනිස්ථානයේ හා පාකිස්ථානයේ ඇතැම් ප්‍රදේශවල ව්‍යවහාර කෙරෙන භාෂා 'නූරිස්ථානි' ('කපිර් හෙවත් දාර්දික්') භාෂා ලෙස නම් කෙරේ. 'ඉන්දු-ආර්ය', 'ඉරාණීය', 'නූරිස්ථානි' ('කපිර් හෙවත් දාර්දික්') 'උපගණ' 'ඉන්දු-ඉරාණීය' යන 'ගණය' යටතෙහි ලා සැලකේ (යුරෝපය පුරා පැතිරී සිටින 'ජිප්සි' (අහිකුණ්ටික) ජනයා ව්‍යවහාර කරන 'රොමානි' බස ද ඉන්දු-ආර්ය භාෂාවකි). මේ ඉන්දු-ඉරාණීය ගණය 'ජර්මනික්', 'රෝමන්ස්', 'බෝල්ටෝ-ස්ලැවික්', 'කෙල්ටික්', 'හෙලනික්', 'ආර්මේනියන්', 'ඇල්බේනියන්' යන 'ගණ' ඇතුළත් 'ඉන්දු-යුරෝපීය' භාෂා පවුලට (language family) අයත් වෙයි (Beekes, 1995). ඒ සම්බන්ධය 'කෙන්ටුම්' හා 'ශතම්' යන 'කාණ්ඩ' (group) දෙකක් ඔස්සේ ඇති වන්නකි. මේ 'කාණ්ඩ' දෙක මඟින් 'ඉන්දු-ඉරාණීය' භාෂා 'ගණය' (branch) ඇතුළු 'ජීව භාෂා' (living languages) 'ගණ' අටක් 'ඉන්දු-යුරෝපීය' භාෂා පවුලට (language family) සම්බන්ධ වෙයි (Beekes 1995); O'Grady, 1996). මේ භාෂා පවුලට අයත් සෙසු 'ගණ' වනුයේ

1. 'ජර්මනික්' භාෂා ගණය (ඉංගිරිසි, ජර්මානු, ඕලන්ද, ස්කොට්, නෝර්වේජියන්, අයිස්ලන්ත, ස්වීඩිශ් යන භාෂා ඇතුළත් ය),
2. 'රෝමන්ස්' (ඉටැලික්) භාෂා ගණය (ප්‍රංස, ඉතාලි, ස්පාඤ්ඤ, පුර්තුගීසි, රුමේනියන් හා ලතින් භාෂා මෙයට ඇතුළත් ය).
3. 'බෝල්ටෝ-ස්ලැවික්' ගණය (මෙය ලැට්වියානු හා ලිතුවේනියානු භාෂා ඇතුළත් 'බෝල්ටෝ' උපගණය හා රුසියානු, යුක්රේනියානු, බල්ගේරියානු, චෙක්, ස්ලෝවැක්, බෙලරුසියානු, පෝලන්ත, මැසිඩෝනියානු, සර්බියානු ආදි භාෂා ඇතුළත් 'ස්ලැවික්' උපගණය යන උපගණ දෙකකින් සමන්විත ය).
4. 'කෙල්ටික්' ගණය (අයිරිශ්, වේල්ස්, ස්කොටිශ්-ගැලික්, කෝනිශ්, බ්‍රෙටෝන් හා මැන්ක්ස් යන භාෂා මෙයට අයත් වෙයි).
5. 'හෙලනික්' ගණය (ග්‍රීක් හා මැසිඩෝනියන් භාෂා ඇතුළත් ය).

6. ඇල්බේනියන් බස පමණක් ඇතුළත් 'ඇල්බේනියන්' ගණය
7. ආර්මේනියන් බස පමණක් ඇතුළත් 'ආර්මේනියන්' ගණය යි.

වර්තමානයේ අභාවිත භාෂා කිහිපයක් ඇතුළත් ව පැවති සේ සැලකෙන 'හිටයිට්', 'ඇනටෝලියන්', 'ඒජියන්', 'ටොඛාරියන්' හා තවත් 'ගණ' කිහිපයක් ද ඉන්දු-යුරෝපීය භාෂා පවුලට අයත් ව තිබුණු බව ඓතිහාසික වාග්විද්‍යාඥයෝ පෙන්වා දෙති. 'ඇනටෝලියන්' යනු 'ඉන්දු-යුරෝපීය' පවුලේ භාෂා ගණයක් නො ව පරිකල්පිත මූල ඉන්දු-යුරෝපීය භාෂාවේ භ්‍රාතෘ භාෂාවක් විය හැකි බවටත් 'හිටයිට්' හා 'ඒජියන්' එහි දුහිතෘ භාෂා බවටත් මත ඉදිරිපත් වී තිබේ.

**ශ්‍රී ලංකා භාෂා කලාපය**

දැනට ශ්‍රී ලංකාවේ ව්‍යවහාර භාෂා ගණන සම්බන්ධයෙන් ඒකමතිකත්වයක් නොමැති බව පෙනේ. *Ethnologue* 15 වන මුද්‍රණයට අනුව ඒ ගණන අටකි; බහුතර ජන කණ්ඩායමේ භාෂාව වන සිංහලය, දෙවන ජන කණ්ඩායමේ භාෂාව වන දෙමළ බස, පුර්තුගීසි ක්‍රියෝල් ව්‍යවහාරය, මැලේ ක්‍රියෝල් ව්‍යවහාරය, සිංහලය පදනම් කොට ගත් ක්‍රියෝල් ස්වරූපයක් සේ සැලකෙන වැදි බස හා දක්ෂිණ බුදුසමයේ සම්භාව්‍ය භාෂා ව්‍යවහාරය වන පාලි භාෂාව ද සිංහල සංඥා භාෂාව ද ඊට ඇතුළත් ය (Gordan, 2005: 509-10) 2018 දී ආසියානු භාෂා අළලා සම්පාදිත *Ethnologue* 21 වන මුද්‍රණයෙහි ඒ ගණන දැක්වෙනුයේ හතක් ලෙසිනි; පාලි භාෂාව ඉන් ඉවත් කොට තිබේ. සිංහලය දිවයිනේ ජනගහනයෙන් 74%කගේ මවු බස වෙයි. දෙමළ ජන ප්‍රතිශතය 25.3%ක් සේ සැලකේ. පුර්තුගීසි හා මැලේ ක්‍රියෝල් ව්‍යවහාර මවු බස සේ සලකන ජන සංඛ්‍යාව 1991 දී වාර්තාගත වන අන්දමට පිළිවෙළින් 60,000ක් හා 40,000ක් වන අතර 20,000ක් පමණ පිරිසක් ඉංගිරිසිය ප්‍රධාන භාෂා ව්‍යවහාරය සේ සලකන බව පෙන්වා දෙනු ලැබේ. මේ තුන් පිරිස ම ප්‍රතිශතයක් සේ ගත් කල 0.7% නො ඉක්මවයි (Breton, 1997: 179). ඩේවිඩ් ක්‍රිස්ටල් 1997 දී දක්වන අන්දමට ඉංගිරිසිය මුල් බස සේ සලකන ශ්‍රී ලාංකික ජන සංඛ්‍යාව ආසන්න වසයෙන් 10,000කි (Crystal, 1998: 59). 2017 දී ප්‍රකාශිත නිල ප්‍රකාශනයක් වන *People of Sri Lanka* තොරතුරු සංග්‍රහය අනුව දිවයිනේ ජන කොටස් 19ක් හඳුනා ගනු ලැබ ඇත. ඒ අනුව, ඉහත සඳහන් කරන ලද භාෂාවලට අමතර ව මලයාලම්, චීන, සින්ධි, මෙමනි හා පාර්සි භාෂා ඒ ජන කොටස් විසින් ව්‍යවහාර කෙරේ. වැදි බස ද සැලකෙන්නේ සිංහලය හා මිශ්‍ර වූ ක්‍රියෝල භාෂාවක් ලෙසිනි. එසේ ද වුව මේ ජන කොටස් තුනින් වැදි ජනයා ආදි වාසී ජන කණ්ඩායම් සමඟ සම්බන්ධ කිරීම අසීරු නො වන බැවින් ඔවුන්ගේ භාෂාව මූල ඔස්ට්‍රෝ-ඒෂියාටික් හෝ ඔස්ට්‍රනීශියන් හෝ සම්භවයක් සම්බන්ධ සාධක සඟවා ගත් භාෂා සේ සැලකීම අසීරු නො වන ඇත. එය උත්තර භාරතීය ආර්ය භාෂක ජනයාගේ පැමිණීම හේතුවෙන් 'ආර්යකරණයට' ලක් වීම එහි ක්‍රියෝල ස්වභාවයෙහි පදනම විය යුතු ය (ධර්මදාස, 1972). දකුණු ඉන්දියානු මහා භූ කලාපයේ භාෂා විචිත්‍රත්වය මෙන් ම අක්ෂර රූපීය විවිධත්වය සම්බන්ධ සාධක අනාවරණය වන හුදෙකලා දූපත් රාජ්‍යයක් වන ශ්‍රී ලංකාව ස්වාධීන භාෂා කලාපයක ලක්ෂණ පෙන්නුම් කරන්නකි.

ලංකාවේ අහිකුණ්ටික ජනයා සැලකෙනුයේ තුළු හෝ තෙලුගු හෝ ව්‍යවහාරයකින් භින්න ව සිංහලය සමඟ මිශ්‍ර වූ භාෂා ස්වරූපයක් ව්‍යවහාර කරන්නන් ලෙස ය. ඉන්දියානු සම්භවයක් සහිත, ඉන්දු-ආර්ය භාෂක (රෝමානි බස) සංචාරක ජන කොටසක් වන ජිප්සි ජනයා හා ලක්දිව අහිකුණ්ටික ජනයා අතර සමානත්වයක් දැක ගත නො හැකි බව පෙනේ. ලංකාවේ අහිකුණ්ටික ජනයා දකුණු ඉන්දියානු සංචාරක ජන කොටස් හා සම්බන්ධයක් දක්වන පිරිසක් සේ හඳුනා ගත හැකි ය (සිං. වි. කෝ. 1965: 355-56).

'රොඩී' නමින් හඳුන්වනු ලබන ජන කොටස සැලකෙනුයේ සිංහලයේ උපසංස්කෘතික සමාජ ස්තරයක් ලෙසිනි. ඔවුන්ගේ භාෂාව ද සිංහලයේ උපභාෂාවක් සේ සැලකේ. එහෙත් රොඩී ජනයා ද දකුණු ඉන්දියානු සම්භවයක් සහිත ජන කොටසක් ලෙස ද රොඩී බස ද ඉන්දියානු කුඩා ජන කොටස්වල භාෂා ව්‍යවහාර සමඟ ඥාතිත්වයක් දක්වන බව ද හඳුනා ගත හැකි ය (Raghavan, 1951: 110).

මේ භාෂා වෛචිත්‍රයය හේතුවෙන් ශ්‍රී ලංකාව ස්වාධීන භාෂා ක්ෂේත්‍රයක් සේ සැලකීමට ඇතැම් භාෂාඥයෝ යොමු වෙති. දකුණු ආසියා භාෂා කලාපය ඉක්මවූ භාෂා ඥාතිත්ව සම්බන්ධතා සහිත වීම (ඔස්ට්‍රනීශියන් (ශ්‍රී ලංකා මැලේ ක්‍රියෝලය) හා ඉන්දු-යුරෝපීය පවුලේ රෝමන්ස් ගණයේ භාෂා (ශ්‍රී ලංකා පුර්තුගීසි ක්‍රියෝලය) හේතුවෙන් දකුණු ආසියා භාෂා ක්ෂේත්‍රය ඉක්මවූ ලක්ෂණ ප්‍රවර්තනය කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු වී තිබේ (Bakker, 1995).

දෙමළ භාෂාවේ උපභාෂා ස්වරූප කිහිපයක් (Breton, 1997) දිවයිනෙහි ව්‍යවහාර වීම ද ස්වාධීන භාෂා ක්ෂේත්‍රයක පැවැත්ම සම්බන්ධ සාධකයක් සේ සැලකිය හැකි ය (Ansaldo, 2008).

කලාපීය භාෂා විචිත්‍රතාව අධ්‍යයනයේ දී 'ශ්‍රී ලාංකේය භාෂා කලාපයේ' විස්තෘතිය හා ඉතිහාසය කෙරෙහි අපේ විශේෂාවධානය යොමු විය යුතු වන්නේ එහි ප්‍රධාන භාෂාව වන සිංහලය ඉහත දක්වන ලද නූතන ව්‍යවහාර භාෂා අතුරෙහි අඛණ්ඩ ඓතිහාසික සන්තතියක් පෙන්නුම් කරන 'එක ම' භාෂාව සේ සැලකිය හැකි බැවිනි.

**දකුණු ආසියා භාෂා කලාපයේ ස්වරූපය හඳුනා ගැනීම**

කලාපීය භාෂා විවිධත්වය සම්බන්ධ අධ්‍යයනයන්හි දී අවධානය යොමු වී ඇති ප්‍රධාන කරුණක් වන්නේ මේ එක් එක් භාෂා පවුල් හෝ භාෂා ගණ අන්‍යෝන්‍ය වසයෙන් සුබෝධනීය නො වූ ස්වාධීන භාෂාවලින් සමන්විත වන බව යි. නිදසුනක් වසයෙන්, ඉන්දියාවේ රාෂ්ට්‍ර භාෂාව වන හින්දී බසත් තමිල්නාඩු ප්‍රාන්තයේ ප්‍රධාන භාෂාව වන දෙමළ බසත් පිළිවෙළින් ඉන්දු-යුරෝපීය භාෂා පවුලේ ඉන්දු-ඉරාණීය ගණයේ ඉන්දික භාෂා විශේෂයට හා ද්‍රාවිඩ භාෂා පවුලට අයත් භාෂා දෙකකි. එදෙක අතර ප්‍රභවාත්මක සමානකම් දැකිය නො හැකි අතර ශබ්දයෝගවිචාර, පදකයෝගවිචාර හා වාක්‍ය වින්‍යාස ස්තරයන්හි ප්‍රබල වෙනස්කම් විද්‍යමාන වෙයි. ප්‍රභවාත්මක සම්බන්ධතා ඉක්මවමින් සිදු වූ භාෂාමය ලක්ෂණ විසරණයක් ද මේ කලාපයෙහි නිරීක්ෂණය කළ හැකි වෙයි. සංස්කෘතික සංස්පර්ශය හේතුවෙන් හට ගැනුණු සමානතා මෙන් ම කලාපීය වසයෙන් හට ගැනුණු ආකෘතික සමානතා ද ඒ අතරෙහි හඳුනා ගත හැකි වීම විශේෂත්වයකි. එමෙන් ම වාග්විද්‍යාත්මක කේත පද්ධතීන්හි ව්‍යාප්තිය සංකීර්ණ කර දක්වන, වෙන් වෙන් පුරාක්ෂර රූපවිද්‍යාත්මක පරිණාමය සහිත ලේඛන ක්‍රම පද්ධති ද දැක ගත හැකි වෙයි. පූර්වෝක්ත නිදර්ශනයෙහි දක්වන ලද හින්දී හා දෙමළ භාෂා සම්බන්ධයෙන් ගත් කල පූර්වෝක්තය සඳහා බ්‍රාහ්මී අක්ෂර මාලාවේ පරිණාමීය ඵලයක් වන 'දේවනාගරී' අක්ෂර මාලාව ද අපරෝක්තය සඳහා සම-සම්භවීය දෙමළ අක්ෂර මාලාව ද භාවිත වන ආකාරය පෙන්වා දිය හැකි ය.

ඉන්දියා භාෂක කලාපයෙහි ප්‍රධාන භාෂා ගණය වන ඉන්දු-ආර්ය ගණයෙහි උරුම ප්‍රදේශය (ශ්‍රී ලංකාව හා මාල දිවයින් හැර) කේවල උපභාෂා සන්තතියක් සහිත භූ කලාපයක් සේ හැඳින ගත හැකි වෙයි. එකිනෙක උපභාෂා කලාප අතර සිදු වන භාෂාමය සංස්පර්ශය මේ උපභාෂා වෙන් වෙන් භාෂා වසයෙන් සනීභවනය වීම වලක්වමින් එකිනෙක හා සම්මිශ්‍ර වන ව්‍යවහාර ප්‍රභේද ගණනාවක් බිහි කරයි. තද් භාෂක කලාපයෙහි ප්‍රාච්‍ය අන්තය වන ඉන්දියා භූ-දේශපාලන කලාපයෙහි නැඟෙනහිර අන්තයෙහි වන ඇසෑමයෙහි පටන් ප්‍රතීච්‍ය අන්තය වන ඇෆ්ගනිස්ථානය තෙක් ( Asia Foundation. 2006; Maniku 2000) මේ සන්තතික විසර්ජනය හඳුනා ගත හැකි ය. සමුච්චිත කලාපයෙහි භාෂාමය විභේදන විස්තෘත වුව ද එකිනෙක උපභාෂා ව්‍යවහාර කලාප අතර භාෂාත්මක සීමා දැක්වීම අපහසු ය (Masica 1993: 25). වංශපරම්පරාත්මක ව භාෂා වර්ග කිරීමේ දී කිසි යම් ව්‍යවහාර ප්‍රභේදයක් ස්වාධීන භාෂාවක් ද නො එසේ නම් වෙනත් භාෂාවක උපභාෂා ප්‍රභේදයක් ද යන්න නිර්ණය කිරීම 'භාෂා' හා 'උපභාෂා' යන සංකල්ප විග්‍රහ කරන ආකාරය මත රඳා පැවතීම මේ කලාපයේ භාෂා වර්ගීකරණයේ දී මුහුණ පෑමට සිදු වන තවත් ගැටලුවක් සේ හඳුනා ගත හැකි ය (Shapiro and Schiffman, 1983: 4). විසි වන සියවස ආරම්භයේ දී 'ඉන්දියාවේ භාෂා සමීක්ෂණ' මැයෙන් කාණ්ඩ එකොළොසකින් සමන්විත ග්‍රන්ථාවලියක් සම්පාදනය කළ ජෝර්ජ් ග්‍රියර්සන්ගේ inner (අභ්‍යන්තර) හා outer (පරිබාහිර) ඉන්දු-ආර්ය භාෂා උපවර්ගීකරණය අනුව සිංහලය මෙන් ම ලහඬි, සින්ධි, ගුජරාටි, මරාඨී, බෙංගාලි, බිහාරි, ඇසෑමි හා පහාරි භාෂා ද පරිබාහිර ඉන්දු-ආර්ය ගණයෙහි ලා සැලකේ. හින්දුස්ථානි හා නැඟෙනහිරි පංජාබි භාෂා අභ්‍යන්තර ගණයට අයත් සේ සලකන ලදි. භෝජ්පුරි, නැඟෙනහිරි හින්දී ආදිය සැලකුණේ middle circle (අතරමැද භාෂා) ලෙසිනි. මේ බෙදීම සුනීති කුමාර් චැටර්ජි විසින් වඩාත් ප්‍රබල සාධක ඉදිරිපත් කරමින් නිෂ්ප්‍රභ කරන ලදි. ඒ අනුව පසු ව ග්‍රියර්සන් විසින් මේ උපවර්ගීකරණය සංශෝධනය කෙරිණි. තදනන්තර ව ටර්නර්, කාර්ඩෝනා, කාත්රේ, නිගම් ආදීන් ද උපවර්ගීකරණ දක්වා ඇත. (Masica, 1993: 446) ඇනී මොන්ටාවුට් 'සකර්මක ක්‍රියාවක උක්තය හා අදාළ විභක්ති රූප භාවිතය' (= ergative) පදනම් කොට ගනිමින් [ergative - බටහිර ප්‍රදේශයේ ව්‍යවහාර භාෂා) - non-ergative - නැඟෙනහිර ප්‍රදේශයේ ව්‍යවහාර කෙරෙන භාෂා] අනාකෘතික වර්ගීකරණයකට එළඹෙයි (2009).

දකුණු ආසියානු භාෂා කලාපයේ භාෂා වර්ගීකරණයේ දී වාග්විද්‍යාත්මක සම්බන්ධතා පිළිබඳ වංශාවලී ආකෘතිය උපයෝගි කර ගනු ලැබේ. පූර්වජ භාෂා ස්වරූපවලට සම්බන්ධතා පෙන්වන ශබ්ද පරිණාමය පිළිබඳ ඓතිහාසික වාග්විද්‍යාත්මක රීති හඳුනා ගත හැකි වීම පදනම් කොට ගනිමින් කලාපීය භාෂා තනි භාෂා පවුලක සාමාජිකයන් ('දුහිතෘ භාෂා' හෝ 'භ්‍රාතෘ භාෂා') වසයෙන් සලකමින් සිදු කරන වර්ගීකරණය මෙයින් අභිප්‍රේත වේ. මේ

වර්ගීකරණය අනුව එවැනි සම්බන්ධතා පෙන්වන භාෂා අනිවාර්යයෙන් ම භාෂා වංශාවලියෙහි 'අන්තරීය භාෂා' සේ සැලකෙන අතර සෙසු භාෂා සියල්ල 'පර්යන්තීය' භාෂා සේ සලකනු ලැබේ. සෘණීකෘත වචන මෙහි ලා විශේෂයෙන් අවධානයට යොමු කළ යුතු වන්නේ ඒවා භාෂාවේ සාමාන්‍ය ශබ්දවිද්‍යාත්මක රීතීන්ට පටහැනි ව හැසිරෙන බැවිනි. ඒවා වංශ පරම්පරාත්මක වර්ගීකරණයෙහි ලා පදනම් කොට ගැනෙන 'අන්තරීය' ලක්ෂණ අතරෙහි ලා නො සැලකේ (Shapiro and Schiffman, 1983: 4). මූල භාෂා ප්‍රතිනිර්මාණයෙහි හා වංශ පරම්පරාත්මක වර්ගීකරණයෙහි පදනම වන්නේ වෙනත් භාෂා ව්‍යවහාරයන්හි බලපෑමේ ප්‍රතිඵලයක් වසයෙන් ඇති වූ වාග්විද්‍යාත්මක සාධක ඉවත ලීමෙන් පසු ව ඉතිරි වන ආන්තරික මූලයන් සංසන්දනය යි. මේ සංසන්දනය භාෂා ගණනාවක් එකිනෙක අතර පවත්නා සම්බන්ධතාව පෙන්වීම සඳහා යොදා ගනු ලැබේ. (Crystal, 1992: 292.)

කලාපීය භාෂා සම්බන්ධ අධ්‍යයනයක දී පෙනී යන තවත් වැදගත් කරුණක් වන්නේ 'භාෂා' හා 'උපභාෂා' යන ප්‍රපංච ද්වය නිර්ණය සම්බන්ධයෙන් භාෂාමය සාධක පමණක් ප්‍රමාණවත් නො වන බව යි. ග්‍රියර්සන් මේ ගැටලුව වාර්තා කර ඇත්තේ කිසියම් භාෂණ ස්වරූපයක් ස්වාධීන භාෂාවක් ද නැත හොත් කිසියම් නිශ්චිත භාෂා ස්වරූපයක උපභාෂාවක් ද යන්න තීරණය කිරීම සිය අධ්‍යයනයේ ඇතැම් අවස්ථාවක දී දුෂ්කර වූ බවත් එක ම භාෂාවක විවිධ උපභාෂා ස්වරූප එය මවු බස වසයෙන් ව්‍යවහාර කරන සියල්ලන්ට සෑහෙන තරම් දුරකට ඒකාකාර ව මැනවින් වටහා ගත හැකි වන අතර වෙනත් භාෂා දෙකක් එසේ වටහා ගත නො හැකි බැවින් කිසියම් භාෂකයකුට සිය මවු බස නො වන වෙනත් බසක් තේරුම් ගැනීමට නම් ඒ භාෂාව විශේෂයෙන් අධ්‍යයනය කළ යුතු ය යන භාෂා හා උපභාෂා සම්බන්ධයෙන් පිළිගන්නා නියාමය පමණක් උතුරු ඉන්දියාවේ ව්‍යවහාර වන ආර්ය භාෂාවන්හි ස්වාධීනත්වය නිර්ණය කිරීමෙහි ලා ප්‍රමාණවත් නො වන බවත් පවසමිනි (Grierson, 1968: 23-24).

නැගෙනහිරි ඉන්දියාවේ ප්‍රාන්ත රාජ්‍යයක් වන බටහිර බෙංගාලයේ හා ස්වාධීන රාජ්‍යයක් වන බංග්ලා දේශයේ නිල භාෂාව වන බෙංගාලි බස හා වයඹ දිග ඉන්දියානු ප්‍රාන්තයක් වන පංජාබයේ නිල භාෂාව වන පංජාබි බසත් මවු බස කොට ගත් ස්වභාෂකයන්ට අධ්‍යාපනය මඟින් ලැබෙන ද්විභාෂක ශක්‍යතාව හේතුවෙන් ඉන්දියාවේ රාජ්‍ය භාෂාව වන හින්දී බසෙහි ප්‍රවීණතාවක් හිමි වෙයි. ගෙදර දොර කතාබහේ දී හා සෙසු 'පහළ' අවස්ථාවන්හි (ධර්මදාස, 1972: 80-81) ප්‍රාදේශීය ව්‍යවහාරය (මෙහි පංජාබි හා බෙංගාලි) යොදා ගන්නා භාෂකයා වෙනත් භාෂාමය ආවරණයක දී රාජ්‍ය භාෂාව වන හින්දී බස අපහසුවකින් තොර ව කතා කිරීමට හා වටහා ගැනීමට සමත් වෙයි. භාෂකයකු සිය මවු බස වසයෙන් ව්‍යවහාර කරන භාෂාවක උපභාෂා ස්වරූපයක් වෙනත් භාෂාවක් ලෙස හඳුනා ගන්නේ ඔහුට එම උපභාෂා ස්වරූපය වටහා ගැනීමට හා එමඟින් අදහස් ප්‍රකාශ කිරීමට නො හැකි වීම පමණක් පදනම් කොට ගනිමින් නො වන බව ඉහත දක්වන ලද ග්‍රියර්සන්ගේ අදහසින් පැහැදිලි වෙයි. වාග්විද්‍යාඥයා ඒ භාෂා ද්වයය ව්‍යවහාර ප්‍රභේද දෙක අතරෙහි වන ව්‍යාකරණමය ව්‍යුහයේ වෙනස්කම් කෙරෙහි අවධානය යොමු කළ ද ස්වභාෂකයාට ඒ දෙක වෙන් කර දැක්වීමට බල පාන අනික් වැදගත් සාධකය වන්නේ 'ජාතිකත්වය' යි (Grierson, 1968: 24).

බෙනඩික්ට් ඇන්ඩර්සන්ගේ ප්‍රචලිත ප්‍රවාදය අනුව ජාතියක් යනු 'පරිකල්පිත ප්‍රජාවක්' වන අතර එය විචල්‍ය වන්නකි (Anderson, 1991: 6). ඒ අනුව 'භාෂා භාවිතය' යම් ජන කොට්ඨාසයකට 'ජාතියක්' වසයෙන් පෙනී සිටීමට හෝ 'වෙන් වී සිටීමට' හෝ සාධක වන ආකාරය ඉන්දියා භාෂක කලාපයෙන් පෙන්නුම් කෙරේ. ''ජාතියක් ගොඩනැඟීමට මෙන්ම ජාතියක් කුඩා කොටස්වලට බෙදා හැරීමටද භාෂාව වහල් කොට ගත් අවස්ථා ලෝක ඉතිහාසයෙහි දුර්ලභ නොවේ. එසේම ඇතැම් විටෙක, සංස්කෘතීන් බොහොමයකට මූලාධාර වූ සේ සැලකෙන ආගමය මේ අරමුණු දෙකෙන් එකකට වහල් වූ අවස්ථාද දැක්ක හැකිය. මේ සම්බන්ධයෙන් භාෂාවෙහි ඇති බලය, සමහර විට ආගමය අබිබවා යන්නක් බවද ඓතිහාසික නිදර්ශනවලින් පෙනී යයි'' (බලගල්ලේ, 2012: 79-80) ''බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය යටතේ තනි දේශපාලන ඒකකයක් වශයෙන් පැවති ඉන්දියාව, 1947 දී දේශපාලන ස්වාධීනත්වය දිනා ගන්නා අවස්ථාවේ දී, ඉන්දියාව ම සිය මව් රට වශයෙන් සැලකූ පිරිසක් -, එනම්, පංජාබ් (බටහිර), ඇෆ්ගනියා, කාශ්මීර, සින්ධ්, බලුකිස්ථාන් යන ප්‍රදේශවාසී ඉස්ලාම් ආගම ඇදහූ ජනයා හා නැගෙනහිර බෙංගාලයේ ජනයා-, ඉන්දියාවෙන් වෙන් වී පකිස්ථානය නමින් නව ජාතියක්/නව රාජ්‍යයක් පිහිටුවා ගැනීමේදී මොහොමඩ් ජින්නා ආදි නායකයන් විසින් පෙරටු කර ගන්නා ලද්දේ ආගමික (=සංස්කෘතික) අනන්‍යතාව යි. එහෙත් ඉන් වසර කිහිපයකට පසු නැගෙනහිර බෙංගාලයේ ජනයා, තමන් හා එකම ආගමෙන් බැඳී සිටි (බටහිර) පාකිස්ථානයෙන් වෙන්ව බෙංගාලි ජාතිය (බංග්ලාදේශ රාජ්‍යය) පිහිටුවා ගැනීමේදී මුජිබුර් රහමාන් ආදි බෙංගාලි නායකයන් පෙරටු කර ගත්තේ බෙංගාලි භාෂා සංඛ්‍යාත භාෂාමය අනන්‍යතාව යි. මෙහි දී, තවත් හේතුකාරකයන් සමඟ එක් වෙමින් නමුදු භාෂාමය අනන්‍යතාවට ආගමික සංස්කෘතික අනන්‍යතාව අබිබවා යෑමට හැකි වී තිබේ. එහෙත් එම භාෂාමය අනන්‍යතාව ද්විපක්ෂය අතරෙහි ආගමික වශයෙන් ඇති පරතරය පැන ගොස් භාෂාමය වශයෙන් තමන් හා ඇති අනන්‍යතාව

පෙරටු කොට ගෙන අසල් වැසි බටහිර බෙංගාල ප්‍රාන්තය සමඟ එක් වීම සඳහා ප්‍රයන්ත දැරීමට තරම් ශක්තිමත් නුවූ බව ද, තව දුරටත් පෙනී යයි.'' (බලගල්ලේ, 2012: 80).

ජාතිකත්වය හා භාෂාමය අනන්‍යතාව වාග්විද්‍යාත්මක නො වන සාධක මත පදනම් වන ආකාරය ඉහත නිදසුන්වලින් පැහැදිලි වෙයි. ඉන්දු-ආර්ය භාෂා සම්බන්ධයෙන් මේ ක්‍රමවිරෝධය ක්‍රියාත්මක වන ආකාරය හින්දී හා උර්දු භාෂා පදනම් කොට ගනිමින් පෙන්වා දෙනු ලැබේ. වාග්විද්‍යාත්මක සාධක හා භාෂා ශෛලිය පදනම් කොට ගනිමින් මේ භාෂා ද්වය එක ම උපභාෂාවක සාහිත්‍යික ව්‍යවහාර ප්‍රභේද දෙකක් සේ හඳුනා ගනු ලැබේ. උපභාෂාවක් යනු ප්‍රධාන භාෂාවක ව්‍යවහාර ප්‍රභේදයක් වසයෙන් සලකන කල මේ භාෂා දෙක එක් ප්‍රධාන භාෂාවක උපභාෂා දෙකක් සේ හැඳින්විය හැකි නො වේ. වර්තමානයෙහි ඒවා සැලකෙනුයේ නිල නැත හොත් රාෂ්ට්‍ර භාෂා දෙකක් වසයෙනි (Masica, 1993: 23-27). ජාතිකත්වයට හා රාෂ්ට්‍රීය පිළිගැනීමට අමතර ව ලේඛන ක්‍රම භාවිතය ද මේ තත්ත්වයට බල පායි. හින්දී හා උර්දු සාහිත්‍යික ශෛලීය විභේදන පෙන්නුම් කරන ව්‍යවහාර ප්‍රභේද දෙකක් වන අතර ඒ දෙක එකිනෙකින් වෙනස් කර දැක්විය හැකි එක් අංශයක් වන්නේ දීර්ඝකාලීන සාහිත්‍යික අවශ්‍යතා සඳහා සකස් කොට ගත් වාක්කෝෂමය විභේදන පැවතීම යි. ශබ්දයෝගවිචාරය හා පදකයෝගය අතින් සලකන කල ඒ දෙක අතරෙහි විද්‍යමාන වනුයේ සුළු වෙනස්කම් කිහිපයක් පමණි (Shapiro and Schiffman, 1983: 1). එහෙත් ඒ හින්දී ලේඛනය සඳහා බ්‍රාහ්මී මූලය සහිත දේවනාගරී අක්ෂර මාලාව ද උර්දු ලේඛනය සඳහා පාර්සි-අරාබික සම්භවයක් සහිත ලේඛන ක්‍රම භාවිතය ද ඒ දෙක අතරෙහි පරතරයක් ඇති කිරීමෙහි හේතු වී තිබේ. හින්දී හා උර්දු වෙන් වෙන් භාෂා දෙකක් සේ සැලකීමෙහි ලා අක්ෂර මාලාව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ආකාරය සම්බන්ධයෙන් වාග් විද්‍යාඥයන්ගේ අවධානයට ලක් වූ එක් නිදසුනක් වසයෙන් ප්‍රේම්චන්ද් නම් ලේඛකයාගේ කෘති දැක්විය හැකි ය. ඔහුගේ කෘති දේවනාගරී හා පර්සි-අරාබියානු අක්ෂර මාලාවන්ගෙන් වෙන් වෙන් ව මුද්‍රණය කෙරේ. දේවනාගරී පිටපත් හින්දී සාහිත්‍යයට ද පර්සි-අරාබියානු පිටපත් උර්දු සාහිත්‍යයට අයත් සේ සැලකෙයි. මේ කෘති හින්දී සාහිත්‍යයේ මෙන් ම උර්දු සාහිත්‍යයේ ද සම්භාව්‍ය කෘති සේ පිළිගැනේ. ඔහුගේ වාග්විලාසය වන හින්දුස්ථානී භාෂණ ව්‍යවහාරය හින්දී ස්වභාෂකයන්ට මෙන් ම උර්දු ස්වභාෂකයන්ට ද ඔවුන්ගේ මවු බස කුමක් වුව ද පහසුවෙන් වටහා ගත හැකි වෙයි (Shapiro and Schiffman, 1983: 1; ධර්මදාස, 2024: 92).

**දකුණු ආසියා භාෂා කලාපයෙහි භාෂාත්මක ස්වලක්ෂණ**

භාෂා කලාපයක් පිළිබඳ ව සැලකීමේ දී පොදු පූර්වජ භාෂාවකට දක්වන සම්බන්ධය ඉක්මවමින් විවිධ භාෂා ව්‍යවහාර කෙරෙන ප්‍රදේශ අතර සමාසන්නතාව මත පවත්නා සම්බන්ධතාව කෙරෙහි අවධානය යොමු කෙරේ. සමාසන්නයෙහි ව්‍යවහාර කෙරෙන භාෂා සම්බන්ධයෙන් දැක්විය හැකි එක් නිරීක්ෂණයක් වන්නේ ඒ භාෂා අතර පොදු වාග්විද්‍යාත්මක ලක්ෂණ දැකිය හැකි වීම ය. මේ පොදු ලක්ෂණ ඒ එක් එක් භාෂාවෙහි ස්වාධීන ව වර්ධනය වූ ඒවා නො වේ. මේ තත්ත්වය ලෝක භාෂා කලාප කිහිපයක් සම්බන්ධයෙන් ම දක්නට ලැබෙන්නකි. ''ඉන්දියාව භාෂා කලාපයක් ලෙස'' මැයෙන් 1956 දී නිබන්ධයක් සම්පාදනය කළ මරේ බී. එමෙනෝ (Emeneau 1956) දක්වන අන්දමට භාෂා කලාපයක් යනු භාෂා පවුල් කිහිපයකට අයත් භාෂා ව්‍යවහාර කෙරෙන ප්‍රදේශයක් වන අතර ඒ භාෂාවන්හි, ඒවා අයත් වන භාෂා පවුල්වල සෙසු භාෂාවන්හි දැකිය නො හැකි සුවිශේෂ ගති ලක්ෂණ දැක ගත හැකි වෙයි. (1956: 16 n26.) දකුණු ආසියා කලාපයෙහි වාග්විද්‍යාත්මක අභිසාරිතාව පිළිබඳ ව එකුන් විසි වන සියවස මැද භාගයේ පමණ පටන් භාෂාඥයන්ගේ විමර්ශනාක්ෂිය යොමු වී ඇති අතර සංස්කෘත භාෂාවේ හමු වන මූර්ධන්‍ය ශබ්දයන්ගේ ද්‍රාවිඩ ප්‍රභවය පිළිබඳ ව වැඩි අවධානය යොමු වී තිබීම දැක්විය හැකි ය.

දකුණු ආසියා භාෂා කලාපය නියෝජනය කරන ඉන්දු-ආර්ය භාෂා ගණයට හා ද්‍රාවිඩ, මුණ්ඩා (ඔස්ට්‍රෝ-ඒෂියාටික්) හා ටිබෙටෝ-බර්මන් (සිනෝ-ටිබෙටියන්) වෙන් වෙන් භාෂා පවුල්වලට අයත් භාෂා අතර වංශ පරම්පරාත්මක සම්බන්ධතා නො පැවතුණ ද ඒ සියල්ලෙහි පොදු ලාක්ෂණිකාංග කෙරෙහි වාග්විද්‍යාඥයන්ගේ අවධානය යොමු වී තිබේ. ඉන් පළමු වැන්න සේ දැක්වෙන්නේ මූර්ධන්‍ය ස්පර්ශ නිවර්ත ශබ්දයන්හි (ට, ඨ, ඩ, ඪ) විද්‍යමානත්වය යි (Campbell, 2006: 454). මෙය ද්‍රාවිඩ පවුලේ භාෂාවන්හි සම්පර්කයේ ඵලයක් සේ සැලකේ.

දකුණු ඉන්දියා භාෂා කලාපයේ භාෂා වැඩි ප්‍රමාණයක් කෙරෙන් විද්‍යමාන වන තවත් පොදු ලාක්ෂණිකාංගයක් සේ සැලකෙන්නේ පූර්ව නිපාතයන්ගේ අභාවිතය යි. මෙය මුණ්ඩා ගණයේ භාෂා හැර සෙසු භාෂාවලට පොදු වූවක් බව පිළිගැනේ.

සම්ප්‍රදාන-උක්තය සහිත වාක්‍ය රටාව (dative - subject construction) - එනම් වාක්‍යයක උක්තය ප්‍රථමා විභක්තියෙන් නො යොදා සම්ප්‍රදාන විභක්ත්‍යන්ත රූපයක් යෙදීම - තවත් පොදු ලාක්ෂණිකාංගයකි. නිදසුනක් වසයෙන් හින්දී බසෙහි ''මුකේ මාලූම් ථා'' යන වාක්‍යය ගත් කල 'මුකේ' යනු 'මට' යන අර්ථය දෙන සම්ප්‍රදාන විභක්ත්‍යන්ත රූපයක් වන අතර 'මාලූම්' යන්න 'තේරුණා' 'දැනුණා' අර්ථය ද 'ථා' පුල්ලිංග ඒකවචන අතීතාර්ථය ද පවසයි. සිංහලයෙන් ද මෙවැනි අර්ථ සහිත වාක්‍යය නිර්මාණය කෙරෙනුයේ 'මට තේරෙනවා', 'මට හිතෙනවා' ඈ විසින් සම්ප්‍රදාන විභක්ත්‍යර්ථවත් නාමයක් සමඟිනි. 'මහත්තයාට මහන්සි යි', 'මට ඒ කතාව මතක යි', 'මට පයින් යන්න වුණා', 'මිනිහාට ළමයි කී දෙනෙක් ඉන්නවා ද?' යන වාක්‍ය කොලින් පී. මසිකා විසින් මේ රටාවට අනුගත සිංහල වාක්‍ය ලෙස දක්වා ඇත. (Masica, 1993: 346-49.) මෙවැනි වාක්‍යයන්හි නාමය හා ක්‍රියාව අතර අනුරූපතාව නො දැකිය හැකි බැවින් ඒවාහි යෙදෙන සම්ප්‍රදාන විභක්ත්‍යන්ත රූප වාක්‍යයේ උක්ත කර්තෘ සේ සැලකිය නො හැකි ය. මේ ලක්ෂණය අයිස්ලන්ඩික්, ජර්මන් හා රුසියන් ආදි භාෂාවන්හි ද දක්නට ලැබෙන්නකි (Masica, 1971: 159).

වාක්‍යගත පද සංඝටනාවෙහි උක්ත - කර්ම - ක්‍රියා (S - O - V) යන අනුපිළිවෙළ (අපර නිපාත ද සහිත ව) දැකිය හැකි වීම. පද අනුපිළිවෙළ වෙනස් වීමෙන් සන්දිග්ධතාවක් ඇති විය හැකි බැවින් අක්තය මුලින් ද කර්මය දෙවනු ව හා ක්‍රියාව අවසනට යෙදීම (S - O - V) පදානුක්‍රමය සහිත භාෂාවන්හි අනිවාර්ය ලක්ෂණයක් සේ සැලකෙතත් පාලි හා සංස්කෘත භාෂාවන්හි උක්ත - කර්ම අර්ථ සඳහා වෙන් වෙන් විභක්ත්‍යන්ත රූප ඇති බැවින් මේ අනිපිළිවෙළ එහි ලා අනිවාර්ය නො වන සේ සැලකෙයි (බලගල්ලේ, 2012: 162).

'තිබේ' (to have) යන අර්ථය ප්‍රකාශ කිරීම සඳහා වෙන ම ක්‍රියා රූපයක් නොමැති වීම ද කලාපීය භාෂා ලක්ෂණයක් සේ සැලකේ. සංයෝජක නිපාත හා නිරපේක්ෂ කෘදන්ත භාවිතය ද මෙසේ දක්වනු ලබන තවත් එක් ලාක්ෂණිකාංගයකි (Masica, 1971: 159).

ප්‍රයෝජ්‍යාර්ථය දැක්වීම සඳහා විශේෂ පදකයෝගාත්මක රූපයක් භාවිතය ද කලාපීය භාෂා ලක්ෂණ අතරින් එකකි. සිංහලයෙහි මේ සඳහා ධාතුවෙන් පර ව -ව ප්‍රත්‍යය යෙදේ. එය පුරාණ හා මධ්‍ය ඉන්දු-ආර්ය ව්‍යවහාරයෙහි ඓතිහාසික පරිණාමීය ලක්ෂණ (-ආපය-. -ආවේ- ) පෙන්නුම් කරන අවස්ථාවක් වන අතර මේ හා සමාන පරිණාමීය ලක්ෂණ පෙන්නුම් කරන ප්‍රත්‍යය නූතන ඉන්දු-ආර්ය භාෂාවන්හි හමු වෙයි. (Masica, 1993: 317-20). 'විස්තෘත සංකීර්ණ/සංගත ක්‍රියාව' යනුවෙන් හඳුන්වනු ලබන වාක්‍ය රටාව ද මෙවැනි විශේෂ ලක්ෂණයක් සේ සැලකේ. එනම් ක්‍රියා පදයක අර්ථ පූරණය සඳහා ප්‍රධාන ක්‍රියා පදයට පූර්වයෙන් උපකාරක ක්‍රියා රූපයක් යෙදීම යි. ක්‍රියා පද දෙකක් සංගත වුව ද එයින් ඒකලාර්ථයක් ප්‍රකාශිත ය.

ශබ්දානුකරණ රූප භාවිතය මේ කලාපයෙහි ප්‍රකට ලක්ෂණයක් සේ පිළිගැනේ. මේ ලක්ෂණය බොහෝ භාෂාවන්ට පොදු වුව ද දකුණු හා අග්නිදිග ආසියා කලාපයෙහි එය සුලබ ලක්ෂණයක් සේ සැලකෙයි. මෙය කලාපයෙහි ප්‍රචලිත වෙන් වෙන් භාෂා ගණවලට හා භාෂා පවුල්වලට අයත් ව්‍යවහාර සැමෙකක් සම්බන්ධයෙන් ම විද්‍යමාන වන්නකි. ඉන්දු-ආර්ය ශාඛාව සම්බන්ධයෙන් එය මධ්‍ය ඉන්දු-ආර්ය යුගය තෙක් අතීතයට විහිදෙන්නකි. (Masica, 1993: 78 - 81). මේ ලක්ෂණ අතරින් සමහරක් දකුණු ආසියා කලාපය ඉක්මවමින් යුරේශියා හා අතුරු අප්‍රිකා කලාපයන්ට ද ව්‍යාප්ත වී තිබෙනු නිරීක්ෂණය කළ හැකි ය (Campbell, 2006: 454-455).

**සිංහල භාෂාව ඓතිහාසික හා කලාපීය සන්දර්භයෙහි ස්ථානගත කිරීම:**

සිංහලය ඉන්දු-යුරෝපීය භාෂා පවුලේ ඉන්දු-ඉරාණීය ශාඛාවේ ඉන්දු-ආර්ය උපශාඛාවට අයත් වන බව ඉහතින් පෙන්වා දෙන ලදි. මේ උපශාඛාවේ භාෂා සම්බන්ධ පැරණි ම සාධක අදින් වසර 3500ක් තරම් අතීතයකට දිවෙන බව පිළිගැනේ (Masica, 1993: 50). ආදි ම ලිඛිත සාධක අදින් වසර 2300ක් තරම් අතීතයට ගෙන යා හැකි ය.

විකාසනයේ ප්‍රතිඵල අනුව

පළමු අවධිය: ක්‍රි. පූ. 1500 - 600 (ආදි ඉන්දු-ආර්ය යුගය - වෛදික භාෂාව හා සම්භාව්‍ය හෙවත් ලෞකික සංස්කෘත),

දෙවන අවධිය: ක්‍රි. පූ. 600 - ක්‍රි. ව. 1000 (මධ්‍ය ඉන්දු-ආර්ය යුගය - ආගමික, සාහිත්‍යික, අභිලේඛනගත හා ජන ව්‍යවහාරාගත ප්‍රාකෘත හා ප්‍රාකෘතයන්හි බලපෑමට ලක් වූ සංස්කෘත භාෂාවේ දෙවන අවධිය)

තෙවන අවධියඃ ක්‍රි. ව, 1000 පමණ සිට වර්තමානය තෙක් (නූතන ඉන්දු-ආර්ය යුගය - දෙවන අවධියේ ස්වාධීන විකාසනය) (Masica, 1993: 51).

ඉන්දියානු විද්වතුන් බොහෝ විට පෙන්වා දෙන කරුණක් නම් ඉන්දියාව නිල භාෂා 22ක් සහ දහස් ගණනක් වන දේශීය භාෂා ව්‍යවහාර කරන රාජ්‍යයක් වුවත් එහි වාසය කරන්නවුන් වෙන් වෙන් ජාතීන් 22ක් නො ව 'තනි' ඉන්දියානුවන් සේ සැලකෙන බව යි. මේ තත්ත්වය ඉන්දියාව 'නූතන' යුගයට ප්‍රවිෂ්ට වීම හා සමගාමී ව බුද්ධිමත් හා දූරදර්ශී නායකත්වයක් හා පාලන තන්ත්‍රයක් උරුම වීම හේතුවෙන් ඇති වූවක් සේ ද පෙන්වා දෙනු ලැබේ. නිල භාෂා දෙක තුනක් වටහා ගත හැකි නම් උපමහාද්වීපයේ කවර ම තැනක වුව ද දිවි ගෙවිය හැකි බව මෙන් ම සැම ස්වභාෂකයකු ම ද්විභාෂක හෝ ත්‍රිභාෂක හැකියාව ඇත්තකු සේ සැලකිය හැකි බහුත්ව සමාජයක් බිහි වී ඇති බව ද මෙහි ලා අවධාරණය කෙරෙන කරුණකි (Ananthamurthy, 2006:1-2).

එහෙත් ඉන්දියාවේ ව්‍යවහාර කෙරෙන සිය ගණනක් හෝ ඇතැම් විට දහස් ගණනක් විය හැකි ස්වදේශික භාෂා සියල්ලට ම 'ඒකාබද්ධතාවෙන් යුතු විවිධත්වය' සහිත සම තත්ත්වයක් හිමි වී නොමැති බව ද ඇතැම් විද්වතුන්ගේ මතය යි. ඉන්දියානු සන්දර්භයෙහි ලා සාකච්ඡා වන 'ඒකාබද්ධතාවෙන් යුතු විවිධත්වය' ආගමික හා දේශපාලන අධිපතිවාදය හා සම්බන්ධ වූවක් බව එහි ලා පෙන්වා දෙනු ලැබේ. මේ හේතුවෙන් ගත වූ සියවස මුළුල්ලේ ම දරුණු ප්‍රචණ්ඩකාරී අවස්ථා කිහිපයකට මුහුණ පෑමට සිදු වූ ආකාරය ද එහි ලා සිහිපත් කෙරේ (Montaut, 2005: 75).

දැනට ශ්‍රී ලංකාවේ ප්‍රධාන ව්‍යවහාර භාෂා 5ක් ඇතැයි සැලකේ. ඒ බහුතර ජන කණ්ඩායමේ භාෂාව වන සිංහලය, දෙවන ජන කණ්ඩායමේ භාෂාව වන දෙමළ බස, පුර්තුගීසි ක්‍රියෝල් ව්‍යවහාරය, ක්‍රියෝල් මැලේ ව්‍යවහාරය හා සිංහලය පදනම් කොට ගත් ක්‍රියෝල් ස්වරූපයක් සේ සැලකෙන වැදි බස යනුවෙනි. සිංහලය දිවයිනේ ජනගහනයෙන් 74%කගේ මවු බස වෙයි. දෙමළ ජන ප්‍රතිශතය 25.3%ක් සේ සැලකේ. පුර්තුගීසි හා මැලේ ක්‍රියෝල් ව්‍යවහාර මවු බස සේ සලකන ජන සංඛ්‍යාව 1991 දී වාර්තාගත වන අන්දමට පිළිවෙළින් 60,000ක් හා 40,000ක් වන අතර 20,000ක් පමණ පිරිසක් ඉංගිරිසිය ප්‍රධාන භාෂා ව්‍යවහාරය සේ සලකන බව පෙන්වා දෙනු ලැබේ. මේ තුන් පිරිස ම ප්‍රතිශතයක් සේ ගත් කල 0.7% නො ඉක්මවයි (Breton, 1997: 179). ඩේවිඩ් ක්‍රිස්ටල් දක්වන අන්දමට ඉංගිරිසිය මුල් බස සේ සලකන ශ්‍රී ලාංකික ජන සංඛ්‍යාව ආසන්න වසයෙන් 10,000කි (Crystal, 1998: 59). කලාපීය භාෂා විචිත්‍රතාව අධ්‍යයනයේ දී 'ශ්‍රී ලාංකේය භාෂා කලාපයේ' විස්තෘතිය හා ඉතිහාසය කෙරෙහි අපේ විශේෂාවධානය යොමු විය යුතු වන්නේ එහි ප්‍රධාන භාෂාව වන සිංහලය ඉහත දක්වන ලද නූතන ව්‍යවහාර භාෂා අතුරෙහි අඛණ්ඩ ඓතිහාසික සන්තතියක් පෙන්නුම් කරන 'එක ම' භාෂාව සේ සැලකිය හැකි බැවිනි.

ඉන්දු-ආර්ය භාෂා සම්බන්ධ යුග විභේදනය හඳුන්වා දීමෙන් අනතුරු ව ඒ සම්බන්ධයෙන් අධ්‍යයනයන්හි නිරත වූ විද්වතුන් සියලු දෙනා ම පාහේ සිංහලය සලකා ඇත්තේ නූතන ඉන්දු-ආර්ය භාෂාවක් ලෙසිනි. එහෙත් සිංහල භාෂාව බවට විකාසනය වූ ප්‍රාකෘත භාෂාව සෙසු ප්‍රාකෘතයන්ට වඩා වෙනස් ගමන මාර්ගයක් සහිත බව පෙන්වා දිය හැකි ය. එය මුල් භූමියෙන් වෙන් වීම ආරම්භ වන්නට ඇත්තේ කිකලක දැයි නිශ්චිත ව පැවසීම අසීරු වුවත් ක්‍රිස්තු වර්ෂ තෙවන සියවස වන විට නව්‍ය උපභාෂාවක් වසයෙන් මේ දිවයිනෙහි ස්ථාපනය වී තිබූ බව පිළිගත හැකි ය. සිංහලයට පදනම් වූ ප්‍රාකෘත විශේෂය ඉන්දියාවේ කුමන ප්‍රදේශයක ව්‍යවහාර වූවක් ද යන්න සම්බන්ධයෙන් ද භාෂාඥයන් අතර ඒකමතිකත්වයක් නොමැත. එක් පිරිසක් එය නැගෙනහිරි ඉන්දියානු ප්‍රාකෘතයක් බව පවසන අතර අනික් පිරිස පෙන්වා දෙන්නේ ඊටඑය බටහිර/වයඹ ඉන්දියානු ප්‍රාකෘතයක් බව යි. කෙසේ වුව ද ආදි ම ලේඛන සාධකවල පවා නැගෙනහිරි - බටහිරි සම්මිශ්‍රණයක් හඳුනා ගනු ලැබේ. වඩාත් විශ්වාස දායක මතය සේ සැලකිය හැක්කේ එහි පදනම බටහිර /වයඹ ප්‍රාකෘතයක් වුව ද සංවර්ධනයෙහි ලා නැගෙනහිරි ප්‍රාකෘතයන්හි බලපෑම තීරණාත්මක වී ඇති බව යි. (බලගල්ලේ, 2006ඃ 41.) ක්‍රිස්තු පූර්ව දෙවන සියවසට කාල නිර්ණය කළ හැකි සිංහල ප්‍රාකෘතයේ ආදි ම ලේඛන නිදර්ශනවල පටන් ම එය මහාප්‍රාණ ව්‍යඤ්ජනවලින් තොර වූ අතර ස කාරයට හ කාරාදේශයත් ප කාරයට ව කාරාදේශයත් පෙන්නුම් කරයි. ආදි හා මධ්‍ය ඉන්දු-ආර්ය භාෂාවන්හි ආ දීර්ඝ ස්වර හ්‍රස්වත්වයට පත් වීමත් සංයුක්ත ව්‍යඤ්ජන විසංයුක්ත වීමත් එකල විද්‍යමාන වන ලක්ෂණයකි. ගයිගර් විසින් ප්‍රාක් සිංහල යුගය යනුවෙන් නම් කරන ලද, ක්‍රිස්තු වර්ෂ සිවු වන සියවසේ සිට අට වන සියවස තෙක් අවධියේ දී ස්වර මධ්‍ය දාන්ත්‍ය හා කාකුද්‍ය නිවර්ත ව්‍යඤ්ජනයන්ගේ අභාවයත්, ඇතැම් ස්වර වෙනත් ස්වර බවට පත් වීමත් (ගයිගර්යේ අභිශ්‍රැති න්‍යායය මේ තත්ත්වය පැහැදිලි කරයි.) හඳුනා ගත හැකි ය (බලගල්ලේ, 2006ඃ 44-53).

සිංහල භාෂාව පරිණාමීය අවධීන්ට බෙදීම මුලින් ම සිදු කරන ලද්දේ විල්හෙල්ම් ගයිගර් විසිනි. මුල් බෙදීම ඔහු විසින් ම සංශෝධනය කරන ලද නමුදු වඩාත් ප්‍රචලිත වූයේ එසේ සංශෝධනය කිරීමට පෙර හඳුන්වා දෙන ලද යුග බෙදීම යි. ඒ දෙකෙහි දී ම ක්‍රිස්තු පූර්ව තෙවන/ දෙවන සියවස් පටන් ක්‍රිස්තු වර්ෂ සිවු වන/ පස් වන සියවස් තෙක් අවධිය 'සිංහල ප්‍රාකෘත යුගය' යනුවෙන් ද ක්‍රිස්තු වර්ෂ සිවු වන/ පස් වන සියවස්හි සිට අට වන සියවස තෙක් අවධිය 'පුරාතන සිංහල යුගය' යනුවෙන් ද හඳුන්වා තිබේ. අට වන සියවසේ සිට 13 වන සියවස තෙක් අවධිය හඳුන්වනුයේ 'මධ්‍ය සිංහල යුගය' යනුවෙනි. මේ යුග බෙදීම අනිකුත් ප්‍රාකෘත විශේෂයන්ට අදාළ වන පරිද්දෙන් කරන ලද්දක් බව පෙනී යයි. 13 වන සියවස සිංහල භාෂාවේ නූතන අවධිය යනුවෙන් කළ මුල් හැඳින්වීම සිදත් සඟරාව සම්පාදනය වූ අවධිය සැලකිල්ලට ගනිමින් සිදු කරන ලද්දකි. දෙවනු ව මේ නූතන යුගය සම්භාව්‍ය සාහිත්‍ය යුගය (13-17 සියවස්) හා නූතන යුගය (17 වන සියවසේ සිට ඉදිරියට) යනුවෙන් සංශෝධනය කිරීම ද සිංහලයේ විකාසනය සෙසු ප්‍රාකෘත හා සමාන්තර කොට සැලකීමෙන් කරන ලද්දක් බව පෙනේ.

සිංහලයේ නූතන යුගය ක්‍රිස්තු වර්ෂ අට වන සියවසින් ආරම්භ වන සේ සලකන ඝටගේ නව වන සියවසේ පටන් සාහිත්‍ය කෘති විද්‍යමාන වන බව ද සඳහන් කරයි (Ghatage, 1962: 132). සාහිත්‍ය කෘති සම්බන්ධ ආදි ම සාධක තවත් සියවස් තුනක් පමණ ඉදිරියට ගෙන යා හැකි ය. මේ වූ කලි සෙසු නූතන ඉන්දු-ආර්ය භාෂාවන්හි දැකිය නො හැකි තත්ත්වයකි.

සිංහලයේ ආරම්භක අවධිය හා එහි විකාසනය සිදු වූ ආකාරය හැදෑරීම සඳහා ප්‍රමාණවත් සාධක ආරක්ෂා වී තිබීම මේ සම්බන්ධ ඉදිරි විමර්ශනයක දී අතිශයින් වැදගත් වෙයි. සෙනරත් පරණවිතාන ප්‍රමුඛ පුරාක්ෂර විශේෂඥයන් හා භාෂාඥයන් ඒ සාධක අනුසාරයෙන් ඉදිරිපත් කරන ලද කරුණු පදනම් කොට ගනිමින් විමල් ජී. බලගල්ලේ ගයිගර්ගේ යුග බෙදුම් සංශෝධනය කරමින් සිංහල ප්‍රාකෘත යුගය තවත් මෑතට ගෙන එයි. ඒ ගයිගර් දැක්වූ පුරාතන සිංහල යුගය ද ප්‍රාකෘත යුගයට ඇතුළත් කරමිනි. ගයිගර්ගේ මධ්‍ය සිංහල යුගයේ ආරම්භක සීමාව එසේ ම ගනිමින් එහි අපර සීමාව ක්‍රි. ව. 18 වන සියවස තරම් මෑතට ගෙන ඒම ද බලගල්ලේගේ සංශෝධනයෙහි දී දැක ගත හැකි ය (බලගල්ලේ, 2006: 62). ක්‍රිස්තු පූර්ව තෙවන සියවසේ පටන් ක්‍රිස්තු වර්ෂ අට වන සියවස තෙක් අවධියෙහි භාෂා ලක්ෂණ සැලකිය යුතු ප්‍රමාණයක් සෙසු ප්‍රාකෘතයන්ට ද පොදු බවත් අට වන සියවසින් මෑත යුගයේ විද්‍යමාන වන ලක්ෂණ සිංහලයේ ස්වලක්ෂණ සේ සැලකිය හැකි බවත් පදනම් කොට ගෙන මේ සංශෝධනය සිදු කොට තිබේ. විදේශාක්‍රමණ හේතුවෙන් බිඳ වැටුණු සාම්ප්‍රදායික අධ්‍යාපන ක්‍රමය නඟා සිටුවීමට ප්‍රයත්න දැරීම හා පැරණි ග්‍රන්ථ මාර්ගය අනුගමනය කරමින් නව සාහිත්‍යයක් ගොඩ නැඟීමට තැත් කිරීම නව්‍ය භාෂා යුගයක ආරම්භය සේ සැලකිය හැකි බව පෙන්වා දෙන බලගල්ලේ ආගමික හා ශාස්ත්‍රීය වාද විවාද මඟින් මෙන් ම නූතන සන්නිවේදන මාධ්‍යයන්හි ආරම්භය ද පොදු අධ්‍යාපන ක්‍රමයක් හඳුන්වා දීම හා විශ්ව සාහිත්‍යයේ ආභාසය ලැබීම ද හේතුවෙන් සිංහල භාෂාව එහි පරිණාමයේ නව යුගයට ප්‍රවිෂ්ට වූ බව දක්වයි (බලගල්ලේ, 2006: 67-69).

මේ සාධක හා මතවාද විමර්ශනය කිමෙන් සිංහල භාෂාව සම්බන්ධයෙන් මතු කළ හැකි ප්‍රධාන ප්‍රශ්නයක් වන්නේ එය 'නූතන ඉන්දු-ආර්ය' භාෂාවක් සේ සැලකිය යුතු ද යන්න යි. 'නූතන ඉන්දු -ආර්ය භාෂා' 'මධ්‍ය ඉන්දු-ආර්ය ප්‍රාකෘත' 'අපභ්‍රංශ' අවධියක් පසු කිරීමෙන් පසු ව සම්භවය වූ ඒවා ය. සිංහලය සම්බන්ධයෙන් එබඳු අපභ්‍රංශ අවධියක් නිශ්චිත ව දැක්විය නො හැකි වෙයි. එහෙත් ඇතැම් 'අපභ්‍රංශ ලක්ෂණ' ක්‍රිස්තු වර්ෂ 4 - 7 සියවස් අතර ලේඛන කිහිපයකින් පමණක් විද්‍යමාන වෙයි (බලගල්ලේ, 2006: 52). තත් ප්‍රදේශීය ප්‍රාකෘත ව්‍යවහාරයන්හි ඍජු විකාසන සේ නො දැක්වෙතත් නූතන සිංහලය පැහැදිලි ලෙස ම 'සිංහල ප්‍රාකෘතය' නමින් හැඳින්වෙන ආදි ම ව්‍යවහාරයේ ක්‍රම විකාසයෙහි ප්‍රතිඵලයක් බව ඉඳුරා ම පැවසිය හැකි ය. නූතන ඉන්දු-ආර්ය භාෂාවන්හි සාහිත්‍යික ව්‍යවහාර ක්‍රිස්තු වර්ෂ 10 - 12 සියවස්වලින් ඈතට නො දිවෙන නමුදු සිංහලයේ සාහිත්‍යික ව්‍යවහාර සම්බන්ධ අවිනෂ්ට සාධක සවන සියවස තරම් ඈතට ගෙන යා හැකි ය. වංස කථා හා වෘත්තාන්තවලින් අනුමේය වන පරිදි සිංහල සාහිත්‍යයේ ආරම්භය තවත් සියවස් දෙක තුනක් තරම් ඈතට ගෙන යා හැකි අතර එය සෙසු ප්‍රාකෘත සාහිත්‍යයන්ට වඩා ස්වාධීන ලක්ෂණ සහිත බව පෙන්නුම් කෙරේ.

සිංහල භාෂාවේ මේ ස්වලක්ෂණවලට තුඩු දුන් හේතු කවරේ දැයි මෙහි ලා විමර්ශනය කිරීම වැදගත් ය. 'මධ්‍ය ඉන්දු-ආර්ය භාෂා' සංස්කෘතය ව්‍යවහාර වූ ප්‍රදේශයන්හි ම භාෂණ ව්‍යවහාර වසයෙන් පැවති අතර සිංහලයට පදනම වැටුණේ මුල් භූමියෙන් හුදෙකලා වුණු ප්‍රාකෘතයකිනි. මධ්‍ය ඉන්දු-ආර්ය ප්‍රාකෘතයක සිට ස්වාධීන උපභාෂාවක් වසයෙන් වර්ධනය වීම කෙරෙහි ආදි වාසී භාෂාවන්හි උපස්තරීය බලපෑම තීරණාත්මක විණැයි සැලකිය හැකි වන්නේ සිංහල ප්‍රාකෘතය සමාරම්භයෙහි පටන් මුල් භූමියෙහි වූ ප්‍රාකෘත ව්‍යවහාරවලින් අන්‍යතර මුහුණුවරක් පෙන්නුම් කරන බැවිනි. එසේ ද වුව ඒ සම්බන්ධ නිශ්චිත සාධක අවශේෂ වී නොමැත. 'මධ්‍ය ඉන්දු-ආර්ය භාෂා'

සංස්කෘතය සමග මෙන් ම එකිනෙක 'මධ්‍ය ඉන්දු-ආර්ය භාෂා' සමග සංස්පර්ශයට ලක් වූ අතර සිංහලයට මුල් වූ ප්‍රාකෘතය ද්‍රාවිඩ පවුලට අයත් ප්‍රධාන භාෂාවක් වන දෙමළය සමග දීර්ඝ කාලයක පටන් සංස්පර්ශයට ලක් විය. මේ සමීපාශ්‍රයයන් නිසා සිංහලයට මුල් වූ ප්‍රාකෘත භාෂාව සෙසු 'මධ්‍ය ඉන්දු-ආර්ය භාෂා' විශේෂයන්ට වෙනස් පරිණාමීය මාර්ගයකට අවතීර්ණ වී තිබේ.

මෙහි ලා විසඳා ගත යුතු ප්‍රශ්න වන්නේ ''සිංහලය 'ප්‍රාකෘත' තත්ත්වයෙන් මිදුණේ කිකල ද'' යන්න හා ''සිංහලයේ 'නූතන' යුගයේ ආරම්භය කෙදිනක සිදු වන්නට ඇත්ද'' යන්න යි. එය අට වන සියවස් තරම් ඈතක දී 'නූතන' සිංහලය බවට පත් වී ද? නැත හොත් 17 - 18 සියවස්හි යුරෝපීය බලපෑම හේතු කොට ගෙන උද්ගත වූ තත්ත්වයන්හි ප්‍රතිඵලයක් වසයෙන් මධ්‍යකාලීන ලක්ෂණ අත් හැර නූතන යුගයට ප්‍රවිෂ්ට වී ද යන්න විමර්ශනීය මාතෘකාවකි.

**සිංහලයේ ඓතිහාසිකත්වය - නැවත විමසීමක්:**

මේ දක්වා ගෙන හැර දක්වන ලද කරුණු අනුව සිංහලයේ ඓතිහාසිකත්වය හා අනන්‍යතාව සම්බන්ධයෙන් අපට එළඹිය හැකි නිගමනය වන්නේ එය බෙංගාලී, හින්දී, පංජාබි, ගුජරාටි ආදි 'නූතන ඉන්දු-ආර්ය' භාෂාවකට වඩා පුරාතන භාෂාවක් සේ සැලකිය යුතු බව යි. කාලානුක්‍රමනය අනුව, සිංහලයේ 'දුහිතෘ භාෂාව' සේ සැලකෙන 'දිවෙහි බස' යට කී 'නූතන ඉන්දු-ආර්ය' භාෂා හා සම ස්ථාන ගනී. එසේ නම් සිංහලය ස්ථානගත කළ යුත්තේ කොතැනක දැයි යන්න විසඳා ගත යුතු ය. එක් අතකින් සිංහලය පාලි භාෂාව හා සමප්‍රභව හා සමකාලික සේ නිගමනය කිරීම අසීරු නො වේ. පාලි භාෂාව මාගධී ප්‍රාකෘතය හෝ අර්ධ මාගධිය හෝ අවන්ති ප්‍රාකෘතය හෝ පදනම් කොට ගනිමින් බෞද්ධ ධර්මය වාචෝද්ගත කිරීම සඳහා සංස්කරණය කර ගත් භාෂාවක් ය යන මතය (Rahula, 1984: 211-218) මෙන් ම අශෝක ලිපි අතර පාලියෙන් ලියවුණු ලිපි දක්නට නො ලැබීම යන කරුණු සැලකීමෙන් පාලිය ජන ව්‍යවහාරගත ප්‍රකෘතයක් නො ව සාහිත්‍යික ප්‍රාකෘතයක් සේ හඳුනා ගත හැකි ය. පළමු ධර්ම සංගායනාවේ දී බුදුන් වහන්සේගේ ඉගැන්වීම් හා තදීය අර්ථකථන පාලියෙන් ඉදිරිපත් නො කරන ලද්දේ නම් එය තෙවන සංගායනාවේ දී ධර්ම ප්‍රචාරක අවශ්‍යතා සලකමින් සකස් කර ගන්නා ලද්දක් විය හැකි ය. ආර්ය භාෂකයන් විසින් මේ දිවයින ජනාවාස කිරීම බුද්ධ කාලය වන විට අරඹා තිබෙන්නට ඇතැයි වෘත්තාන්ත මෙන් ම ඓතිහාසික විස්තර ද පුරාවිද්‍යාත්මක සොයා ගැනීම් ද සලකන කල නිගමනය කළ හැකි බැවින් සිංහල භාෂාවට මුල් වූ ප්‍රාකෘතය ඒ වන විට මෙරට ප්‍රචලිත වෙමින් පවතින්නට ඇතැයි විශ්වාස කිරීම අයෝග්‍ය නො වේ. පාලි භාෂාව හා සිංහලය සමකාලික හා සමප්‍රභව සේ සැලකිය හැක්කේ එනයිනි. අවිනෂ්ට ආදි ම ලේඛන සාධකවලින් ප්‍රකට වන පරිදි එකල පටන් ම සිංහලය (සිංහල ප්‍රාකෘතය) සෙසු ප්‍රාකෘතවලින් වෙනස් ලක්ෂණ සහිත ව වර්ධනය ආරම්භ කොට තිබිණි. එය නව මුහුණුවර ගැනීම 'නූතන ඉන්දු-ආර්ය යුගය' ආරම්භ වීමට පෙරාතු ව සිදු වූ ආකාරය ඉහත සාකච්ඡා කෙරිණි.

වර්තමාන සිංහලයේ අනන්‍යතා ලක්ෂණයක් වන භාෂා ද්විරූපතාවේ ආරම්භය ද ක්‍රිස්තු වර්ෂ දස වන සියවස තරමේ, එනම් 'නූතන ඉන්දු-ආර්ය යුගය' ආරම්භ වීමට පෙර ආරම්භ වන්නට ඇතැයි නිගමනය කිරීම යෝග්‍ය ය. එකොළොස් වන සියවසේ සිංහල ගද්‍ය ව්‍යවහාරය සංස්කෘත මෙන් ම පාලි තත්සම රූප බහුල වාග්විලාසයක් බවට පත් වීම මිශ්‍ර සිංහල නමින් ප්‍රකට වර්තමාන භාෂා රීතියේ මූලාරම්භය සේ සැලකිය හැකි ය. ධර්මප්‍රදීපිකාවේ සුළුකලිඟුදාවෙන් ප්‍රකට වන පරිදි අමිශ්‍ර 'හෙළ' වාග්විලාසය ද මෙකල ව්‍යවහාරයෙහි පැවති බව පෙනේ. මෙය පද්‍ය රචනය සඳහා අමුතුවෙන් සකස් කර ගත් ශෛලියක් යැයි සැලකිය හැක්කේ සීගිරි කුරුටු ගීතීන්හි පටන් කෝට්ටේ යුගයේ පද්‍යාවලිය තෙක් පද්‍යකරණය සඳහා එය භාවිත වූ බැවිනි. පොලොන්නරු යුගයේ යැයි නිශ්චිත ව සැලකෙන iiodj; හා uqjfoõodj;ත් දඹදෙණි යුගයේ රචිත lõis¿ñKත් මෙන් ම පද්‍යයෙන් රචිත ශාස්ත්‍රීය ග්‍රන්ථ සේ සැලකිය හැකි iso;a iÕrdj හා t¿ i|ia,l=Kත් පද්‍යකරණය සඳහා විශේෂ වූ අමිශ්‍ර ව්‍යවහාරය හෙවත් හුදු හෙළුව උපයෝග කොට ගෙන රචිත යි. මේ හුදු හෙළුව සත් වන අට වන සියවස් තරමේ දී සිදු වූ භාෂා පරිණාමය හේතුවෙන් හැඩ ගැසුණකි (බලගල්ලේ, 2006: 56).

**සමාලෝචනය**

භාෂා භාවිතයේ විවිධත්වය මෙන් ම අක්ෂර රූප පද්ධති ව්‍යවහාරයේ විවිධත්වය ද පෙන්නුම් කරන ශ්‍රී ලංකා භාෂා කලාපයේ ප්‍රධාන ව්‍යවහාරික හා සාහිත්‍යික භාෂාව වන සිංහල භාෂාව සෙසු 'භ්‍රාතෘ' භාෂාවන්ට වෙනස් පරිණාමීය මාර්ගයක විකාසනය වූ බව පැහැදිලි වෙයි. 'නූතන ඉන්දු-ආර්ය භාෂා' ආරම්භ වීමට පෙර සිංහලය එහි ස්වාධීන මුහුණුවර ප්‍රකට කරමින් වර්ධනය වීම අරඹා සිටි බැවින් එය 'මධ්‍ය ඉන්දු-ආර්ය' භාෂාවක් අන්‍ය භාෂා හා සම්පර්කයට පත් වීමෙන් බිහි වූ නූතන භාෂාවක් සේ සැලකීම යුක්ති යුක්ත ය. සංස්කෘත හා 'පාලි' භාෂා සිංහලයේ

මාතෘ භාෂා ලෙස පිළිගැනීමක් පවතී. භාෂාවක් යම් භාෂාවක උපභාෂා ස්වරූපයෙන් ආරම්භ වී ඓතිහාසික විකාසනයේ ද ප්‍රදේශීය හා සමාජීය විභේදන හා සම්පර්කයන්හි ද ප්‍රතිඵල වසයෙන් ස්වාධීන භාෂාවක් බවට පත් වූ කල ඒ ස්වාධීන භාෂාව උපභාෂා ස්වරූපයෙන් ආරම්භ වීමට මුල් වූ භාෂාව මාතෘ භාෂාව ලෙස සැලකෙයි. එහෙත් සිංහලය සංස්කෘත භාෂාවේ හා 'පාලි' නමින් හැඳින්වෙන භාෂාවේ උපභාෂාවක් ලෙස ආරම්භ වුණු බවට සාධක හමු නො වේ. ඓතිහාසික විකාසනය අනුව, සංස්කෘතයට මුල් වූ වෛදික භාෂාවේ ප්‍රභවයට තුඩු දුන් ප්‍රාකෘත ව්‍යවහාර ප්‍රභේද කිහිපයක් මුල් භූමියෙන් හුදෙකලා වී මේ දිවයිනෙහි ස්වාධීන ව වර්ධනය වීමෙන් හා ඒ එකිනෙක ව්‍යවහාර ප්‍රභේදවල මෙන් ම ආරම්භයේ දී ම මේ දිවයිනෙහි ආදිවාසී භාෂා සමඟත් පසු කාලයෙහි දී මුල් භූමියෙහි භාෂා ව්‍යවහාර හා සංස්පර්ශ නො වූ වෙනත් භාෂා සමඟත් -විශේෂයෙන් ම ද්‍රාවිඩ භාෂා පවුලේ ප්‍රධාන භාෂාව වන දෙමළය - සම්මිශ්‍රණයෙන් සිංහල භාෂාවේ ප්‍රභවය හා විකාසනය සිදු වූ බව පැහැදිලි ය. සංස්කෘත හා පාලි භාෂාවලට සමාන - ඒවායින් තද්භව වූ සේ සැලකෙන - වාක් කෝෂයක් හමු වීමට හේතු දෙකක් හඳුනා ගත හැකි ය. පළමු වැන්න ඒ භාෂාවලට පදනම් වූ ආදි ප්‍රාකෘත ව්‍යවහාර සිංහලයට මුල් වීම යි. දෙවැන්න, සිංහල භාෂාවේ විකාසනයේ දී සමාජ, සංස්කෘතික (අධ්‍යාපන හා ආගමික ආදි) හේතු මත සංස්කෘත හා පාලි භාෂාවලින් තත්සම හා තද්භව කොට ගැනුණු වාක් කෝෂයක් ව්‍යවහාරයට ගැනීම හා ඒ භාෂාවල ව්‍යාකරණ ලක්ෂණවල බලපෑම ලැබීම  බව පෙන්වා දිය හැකි ය. මේ අධ්‍යයනය හුදෙක් පූර්ව සාහිත්‍යික සාධක මත සිදු කරන ලද්දක් වන අතර කලාපීය භාෂා හා අක්ෂර රූපීය සාධක පදනම් කොට ගනිමින් ඉදිරි පර්යේෂණ සඳහා විද්‍යාර්ථීන්ට යොමු විය හැකි ය.

බුරුශස්කි බස ඉන්දු-යුරෝපීය පවුලට අයත් වන බව හා එය බොහෝ විට පැරණි ෆ්රිජියන් (Phrygian) බසින් පැවතෙන්නක් විය හැකි බවට මතයක් ඕස්ට්‍රේලියාවේ Macquarie විශ්වවිද්‍යාලයේ පර්යේෂකයන් කණ්ඩායමක් විසින් ඉදිරිපත් කර තිබේ (Sci.News, 2012).

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Abbi, A. (2003). Vanishing voices of the languages of the Andaman Islands. *Paper presented at the Max Planck Institute of Evolutionary Anthropology*, Leipzig, Germany.

Ananthamurthy, U. R. (2006). *Towards the concept of a new nationhood: Languages and literatures in India*. Talk delivered at Institute of Physics, Bhubaneswar, India.

Anderson, B. (1991). *Imagined Communities: Reflections on the Origin and Spread of Nationalism*. Verso.

Anderson, G. D. S. (2008). *The Munda languages*. Routledge.

Ansaldo, U. (2008). Sri Lanka Malay revisited: Genesis and classification. *Asia Pacific Journal of Human Anthropological Linguistics*, 16(2), 79–106.

Bakker, P. (1995). Pidgins. In J. Arends et al. (Eds.), *Pidgins and creoles: An introduction* (pp. xx-xx). John Benjamins.

Breton, R. J.-L. (1997). *Atlas of languages and ethnic communities of South Asia*. Sage Publications.

Campbell, L. (2006). Areal linguistics. In K. Brown (Ed.), *Encyclopedia of language & linguistics* (2nd ed., *Vol. 1*, pp. 454–460). Elsevier.

Crystal, D. (1992). *The Cambridge encyclopedia of language*. Cambridge University Press.

Crystal, D. (1998). *English as a global language*. Cambridge University Press.

Dani, A. H. (1986). *Indian palaeography* (Reprint ed.). New Delhi.

Daniels, P. T., & Bright, W. (Eds.). (1996). *The world's writing systems*. Oxford University Press.

Deraniyagala, S.U. (1992). *The prehistory of Sri Lanka* (Pts. I & II). Colombo: Archaeological Survey Department.

Ghatage, A. M. (1962). *Historical linguistics and Indo-Aryan languages*. Society of Sri Lanka.

Gordan, R. G. (Ed.). (2005*). Ethnologue: Languages of the world* (15th ed.). SIL International.

Grierson, G. A. (Ed.). (1968). *Linguistic survey of India* (Vols 1-11). Motilal Banarsidass.

Hockett, C. E. (1958). *A course in modern linguistics*. Macmillan.

Krishnamurti, B. (2003). *The Dravidian languages*. Cambridge University Press.

Kuiper, F. B. J., (1967). The Genesis of a Linguistic Area. *Indo-Iranian Journal*, 10: 81-102.

Lyons, J. (1987). *New horizons in linguistics-1*. Penguin Books.

Masica, C.P.(1971). *Defining a linguistic area: South Asia*. Chicago University Press.

Masica, C.P.(1993). *The Indo-Aryan languages*. Cambridge University Press.

Montaut, A. (2005). Colonial language classification, post-colonial language movements and the grassroots multilingualism ethos in India. In M. Hasan & A. Roy (Eds.), *Living together separately: Cultural India in history and politics* (pp 75–116). Oxford University Press.

Muysken, P. (2008). Introduction: Conceptual and methodological issues in areal linguistics. In P. Muysken (Ed.). *From linguistic areas to areal linguistics* (Studies in Language Companion Series), *Vol 90*. John Benjamins.

Pariona, A. (2018, July 9). *Language families of the world*. WorldAtlas. https://www.worldatlas.com/articles/language-families-with-the-highest-number-of-speakers.html

Raghavan, M. D. (1957). *Handsome beggars: The Rodiyas of Ceylon*. Colombo Book Center

Rahula, W. (1984) Pali as a language for transmitting an authentic religious tradition. In G.Dhammapala et al.(Eds.) *Buddhist studies in honour of Hammalava Saddhatissa*. (pp211-218)

Schiffman, H. F. (2003) Bilingualism in South Asia: Friend or foe? *Proceedings of the 4th International Symposium on Bilingualism*

Sci.News. (n.d.). *Sci.News: Breaking science news*. http://www.sci-news.com/

Sci.News. (2012). *Sci-News:* New Indo-European Language Discovered. Accessed: 6-19-2012 | http://www.sci-news.com/othersciences/linguistics/article00403.html.

Shapiro, M. C. & Schiffman, H.F. (1983) *Language and society in South Asia*.Delhi

Thurgood, G. & LaPolla, R. J. (Eds.) *The Sino-Tibetan languages*. Routledge

Tournadre, N. (2014) The Tibetic languages and their classification. In *Trans-Himalayan linguistics. Historical and descriptive linguistics of the Himalayan area*. Berlin: Mouton de Gruyter

Voeglin, C. F. & Voegelin, F. M. (1975). Languages of the world. *Encyclopaedia Britannica* (30 Vols), *Vol. 22*, p.572

ධර්මදාස, කේ. එන් ඕ. (1972). *භාෂාව හා සමාජය.* ලේක් හවුස්.

ධර්මදාස, කේ. එන් ඕ. (2024). *භාෂා ජාතිකවාදය පිළිබඳ විමර්ශන.* සරසවි ප්‍රකාශකයෝ

බලගල්ලේ, විමල් ජී. (2006). *සිංහල භාෂාවේ සම්භවය හා පරිණාමය.* ගොඩගේ.

බලගල්ලේ, විමල් ජී. (2012). *භාෂා අධ්‍යයනය හා සිංහල ව්‍යවහාරය.* ගොඩගේ.

රාජනායක, ආර්. එම්. ඩබ්ලියු. ජී. පී. (2022), *ශ්‍රී ලංකා පුර්තුගීසි ක්‍රියෝල්ලය පිළිබඳ මානවවාග්විද්‍යාත්මක අධ්‍යයනයක්*, (අප්‍රකාශිත නිබන්ධය).

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1947). *ප්‍රාකෘත සංග්‍රහය.* සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම.

හෙට්ටිආරච්චි, ඩී. ඊ. (1964). ලංකාවේ භාෂා (අ) සිංහල භාෂාව. තුළ සෙනරත් පරණවිතාන (සංස්.). *ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය* (1 කා., 1 භා., පි.34-41). කැලණිය විශ්වවිද්‍යාලය.